කුමාර් සංගක්කාර විසින්
2011 ජූලි මස 04 වෙනි සඳු දින
ලෝඩ්ස් ක්‍රිකට් පිටියෙහි
නර්සරි පැවිලියන්හි දී
පවත්වන ලද

# 2011
# එම්සීසී (MCC) ක්‍රිකට් ජීවගුණය
# කෞඩ්රි දේශනය

# ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවේ ජීවගුණය - අපේ විශිෂ්ඨභාවයට උපහාරයක්

2011 ජූලි 04

සභාපතිතුමනි, උතුමාණන්වරුනි, නෝනාවරුනි, මහත්වරුනි,

මෙම වසරේ දේශනය පැවැත්වීමට මා කැමති ද නැද්ද යන්න දැන ගැනීම සඳහා මාව සම්බන්ධකර ගැනීමට CMJ උත්සාහ කරමින් සිටින බවට පණිවිඩය දීමට මගේ කළමනාකාර මහතා මට කතා කරන විට ලෝක කුසලාන තරගාවලියෙන් පසු මා සිටියේ ඉන්දියාවේ ය.

වත්මන් එක් දින ජාත්‍යන්තර තරගාවලිය මැද්දේ අප සිටින්නේය යන කාරණය නිසා මුලදී මම පසුබට වුව ද තරමක් කල්පනා කරනු ලැබීමෙන් පසු එය මා ප්‍රතික්ෂේප නොකළ යුතු ආරාධනයක් වූයේ ය යන්න අවබෝධ කර ගතිමි. ආරාධනය කරනු ලබන ප්‍රථම ශ්‍රී ලාංකිකයා වීම මට පමණක් නොව මාගේ සහෝදර රට වැසියාට ද මහත් ගෞරවයක් විය.

අනතුරුව මා මගේ මාතෘකාව තෝරාගත යුතුව තිබිණ. අද උද්යෝගී ලෙස විවාද වෙමින් තිබෙන බොහෝ මාතෘකාවන්ගෙන් එකක් - තාක්ෂණයේ භූමිකාව, ක්‍රීඩාවේ පාලනය, ටෙස්ට් ක්‍රිකට්හි අනාගතය, සහ දූෂණයේ සාපය විශේෂයෙන් ම මුදලට තරග පාවාදීම වැන්නක් මා තෝරා ගනු ඇතැයි ඔබ බොහෝ දෙනා අපේක්ෂා කරන්නට ඇතැයි මම අනුමාන කරමි.

ඉහත සියල්ල වැදගත් ය. එමෙන් ම ක්‍රීඩාව සම්බන්ධයෙන් ගැඹුරු ආවේදනයක් ඇතිව සිටි ක්‍රිකට් වෘත්තාන්තයක් වන කොලින් කෞඩ්රි ද ඒ සියල්ල පිළිබඳව බලගතු අදහස් ඇතිව සිටින්නට ඇති බව නිසැක ය.

වාර්තාගත වීම  සඳහා මම ද මෙසේ කියමි. ක්‍රීඩාවේ ඉතිහාසයේ තීරණාත්මක සන්ධිස්ථානයක් කරා අප ළඟා වී සිටින බව ද අප ටෙස්ට් ක්‍රිකට් වඩාත් තිරසරව පවත්වා ගැනීම, උද්යෝගිමත් ලෙස තාක්ෂණය වැළඳ ගැනීම,  ක්‍රීඩාවේ ගෝලීය පාලනය පටු ආත්ම ලාභයෙන් ආරක්ෂා කර ගැනීම හා දූෂණය වඩාත් ආක්‍රමණකාරී ලෙස මුලි නුදුරා නොදමතොත් ක්‍රිකට් ක්‍රීඩාව අවිනිශ්චිත අනාගතයකට මුහුණ දෙනු ඇති බව ද මම තරයේ විශ්වාස කරමි.

නමුත් මේ සියල්ලම සිත් බඳනා මාතෘකා වන අතරම මා තුළින් නැගෙන ගැඹුරු හැඟීමට අනුව මට උවමනා කරන්නේ ඔබ සමග කතාන්තරයක්, ශ්‍රී ලංකා ක්‍රිකට්වල කතාන්තරය, කොලින් මහත් සේ සතුටට පත්වනු ඇතැයි මා විශ්වාස කරන ගමනක් බෙදා හදා ගැනීමට ය.  මක් නිසා ද අද ලෝකයේ ක්‍රිකට් ක්‍රීඩා කරන කිසිදු ජාතියක් හුදෙක් ක්‍රීඩාවකට වැඩි දෙයක් වන ක්‍රිකට් ක්‍රීඩාවේ ශක්‍යතාවය වඩා හොඳින් ඉස්මතු කරන්නේ යයි මා විශ්වාස නොකරන නිසා ය.

මෙම දේශනය මුළුමනින් ම ක්‍රීඩාවේ ජීවගුණය පිළිබඳව වන අතර මේ සම්බන්ධයෙන් ගත් කල ශ්‍රී ලංකාවේ ක්‍රිකට් පිළිබඳ කතාන්තරය චිත්තාකර්ෂණීය වේ. ශ්‍රී ලංකාවේ ක්‍රිකට් තව දුරටත් හුදු ක්‍රීඩාවක් නොවේ. එය විනෝද මූලාශ්‍රයක් හා එක්සත් භාවය සඳහා වන බලයක් වන හවුලේ බුක්ති විඳින ලාලසාවකි. එය අපේ සමාජයෙහි කීර්තිමත් ස්ථානයක් ගන්නා සම්පතක් ලෙස සලකන ක්‍රීඩාවකි.

ඉතා කෙටි කාලයක් තුළ පිටස්තර ක්‍රීඩාවක් අපේ ජාතික චෛතසිකයක් බවට, මුළුමනින්ම වාගේ භක්තෝන්මාදී ලාලසයකින් හා ආදරයකින් ක්‍රීඩා කරනු ලබන හා අනුගමනය කරනු ලබන ක්‍රීඩාවක් බවට පත්ව තිබීම අපූර්ව ජනක ය. එය ජාතියට නිශ්චලත්වයක් ගෙන එන ක්‍රීඩාවකි, යුද්ධය හා දේශපාලනය ඉක්මවා යාමේ හැකියාවෙන් යුත් ඒ සා බලසම්පන්න ක්‍රීඩාවකි.

එම නිසා අද රාත්‍රියෙහි ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවේ ජීවගුණය පිළිබඳව කතා කිරීමට මම තීරණය කළෙමි.

## ශ්‍රී ලංකාවේ ඉතිහාසය

නෝනාවරුනි, මහත්වරුනි, මගේ රටේ ඉතිහාසය වසර 2500 කට වඩා ඈතට දිවෙයි.

එය අපට අවාසිදායක කාල මෙන්ම වාසි දායක කාල යන දෙකෙහි දී ම දිගු කාලයක් මුළුල්ලේ ලෝකයේ අවධානය ඇද ගෙන තිබෙන ඉන්දියන් සාගරයෙහි වාසිදායක මූලෝපායික ස්ථානයක පිහිටි අලංකාර දිවයිනකි.

ශ්‍රී ලංකාව ස්වාභාවික රමණීයත්වයෙන් හා සිය ජීවිතය පිළිබඳ ආකල්පය අභ්‍යන්තර හා බාහිර යන දෙකෙහිම ඉක්මනින් වෙනස්වන දේශපාලනයෙන් හැඩ ගස්වා තිබෙන විස්මිත ලෙස දුක් කරදර පීඩාදියෙන් ප්‍රකෘති තත්ත්වයට පත්වන, උද්දීප්ත හා ආගන්තුක සත්කාරයට රුචි ජනතාවක් විසින් ආවර්ධිත සම්පත්වලින් පොහොසත් භූමියකි.

අපේ ඉතිහාසයෙහි කීර්තිමත් සාමයේ හා සෞභාග්‍යයේ කාල පරිච්ඡේද ද මහා කලකෝලාහලයන්ගේ, යුද්ධයේ හා ප්‍රචණ්ඩත්වයේ කාල පරිච්ඡේද ද ඔබට දක්නට ලැබෙනු ඇත. ශ්‍රී ලාංකිකයන් අත්දැකීමෙන් පන්නරය ලබා තිබෙන අතර තමන් සෑම කල්හිම ජීවිතය හා ජීවත් වීම සඳහා වන අපේ අභිරුචිය උත්සවශ්‍රීයට නංවන ඉක්මනින් ප්‍රකෘති තත්ත්වයට පත්වන හා සාඩම්බර සමාජයක් වන බව පෙන්නුම් කර ඇත.

ශ්‍රී ලාංකිකයන් සමීපව එකට බැඳුණු ප්‍රජාවකි. පවුල් ඒකකයේ ශක්තිය අපේ ප්‍රජාවන්ගේ ජීවගුණය පිළිබිඹු කරයි. අපි ප්‍රශ්න ඇසීමට ලැදි හා විනෝදකාමී වූ ද, දුෂ්කරතා හා රළුව උත්සව පවත්වන සමෘද්ධියේ කාල හමුවේ එඩිතරව සිනාසෙන්නා වූ ද ජනතාවකි.

අපි හෙට සඳහා නොව අද සඳහා ජීවත් වෙමු. අපේ දෛනික ජීවිතයේ සෑම සුස්මක්ම ආස්වාදනය කරමු. අපි අපේ උරුමය හා සංස්කෘතිය පිළිබඳව උග්‍ර ලෙස ආඩම්බර වෙමු. සාමාන්‍ය ශ්‍රී ලාංකිකයා එම දැනුමෙන් උස්ව නැගී සිටියි, ආරක්ෂාව සලසා ගනියි.

පෘතුගීසීන්, ලන්දේසීන් හා බ්‍රිතාන්‍යයන් විසින් පවත්වා ගත් වසර හාර සියයකට අධික යටත්විජිතකරණය අපගේ අදම්‍ය ජීවගුණය බිඳ දැමීමට හෝ බාල කිරීමට හෝ සමත් නොවී ය. එසේ වුව ද මෙම සන්දර්භය තුළ අපේ මෑත ඉතිහාසය හා සමාජය මත ක්‍රිකට් ක්‍රීඩාව හඳුන්වා දීම මගින් ඇති කළ බලපෑම මවිතකර හා සැලකිය යුතු තරම් ය.

ශ්‍රී ලාංකිකයෝ සියවස් ගණනාවක් අපේ සමාජය බටහිරකරණය කිරීමට එරෙහිව සමහර විටක බටහිර සම්ප්‍රදාය හා බලපෑම නපුරු හා අනර්ථදායක ලෙස ලසුවට ප්‍රතික්ෂේප කරමින් ඉතා දැඩි ලෙස සටන් වැදුනහ.

එහෙත් කෙසේ වුව ද ක්‍රිකට් අපේ බටහිර විරෝධී ආරක්ෂක විධීන් ගේ විවරයක් ඔස්සේ ලිස්සා යාමට සමත් විය. දැන් එය අපේ බ්‍රිතාන්‍ය යටත්විජිත උරුමයේ ඉතාමත්ම අගනා පාරම්පරික වස්තුවක් බවට පත්ව තිබේ.

එය අපට තිබෙන හැම දෙයකින්ම සමහර විට අපට නැති දේවලින් පවා අමුත්තකුට සංග්‍රහ කරනු ලැබීමේ අපේ ආගන්තුක සත්කාරයේ සරල හැඟීමේ ප්‍රතිඵලයක් වන්නට පුළුවන.

ඔබ ග්‍රාමීය ශ්‍රී ලාංකික නිවසකට ගියහොත් ඔබට තේ කෝප්පයකින් සංග්‍රහ කරනු ඇත. එය නොඉවසිය හැකි පැණි රසයකින් යුත් බව ඔබට දැනෙනු ඇත.  සමහර විට මම මෙය අත්විඳ ඇත්තෙමි. තවදුරටත් සොයා බැලීමේ දී එය එසේ වන්නේ අමුත්තා සීනි ඇතුළුව හැම දෙයකටම වැඩියෙන් හිමිකම් ඇතිව සිටින බවට සත්කාරකයින් විශ්වාස කරන නිසා බව මම දැන ගතිමි. සීනි සපයා ගැනීම අසීරු සුබෝපභෝගී භාණ්ඩයක්වන නිවෙස්වලදී සත්කාරකයන් සීනි පාවිච්චියෙන් තොර වුවත් අමුත්තාට සීනි සහිත තේ කෝප්පයක්  ලැබෙනු ඇත.

## ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවේ මූලයන්

කොලින් කෞඩ්රි හා ක්‍රිකට් සම්බන්ධව ශ්‍රී ලංකාවේ ආදරයට මවිතකර ලෙස ගැලපෙන තේ හා සමාන මූලයන් ඇත්තේ ය.

කොලින්ගේ පියා වන අර්නස්ට් ඉන්දියාවේ තේ වැවිලිකරුවෙකු විය. ඔහු එංගලන්තයේ පාසල් ගිය අතර ඔහුගේ පියාගේ වතුවල ක්‍රීඩා කළේ ය. මට අසන්නට ලැබුණ පරිදි ඔහුට වඩා වසර ගණනාවකින් වැඩිමහල් ඉන්දීය  ළමුන් සමග ඔහු පුහුණුවේ යෙදී ඇත.

ක්‍රිකට් ලංකාවට හඳුන්වා දෙන ලද්දේ 1796 සිට වසර 150 ක පමණ කාල පරාසයක් ආවරණය  කළ යටත් විජිත පාලන සමයේ අර්නස්ට් වැනි මිනිසුන් හා ඉංග්‍රීසි තේ වැවිලිකරුවන් විසිනි. කෙසේ වුව ද ශ්‍රී ලංකාවෙහි ක්‍රීඩාවේ ස්ථාපනය  සම්බන්ධ ගෞරවය යටත්විජිත ආණ්ඩුව අධ්‍යාපන ආයතන ස්ථාපනය කිරීමේ කටයුත්තට ඉඩ හැර තිබූ ඇංග්ලිකානු මිෂනාරිවරුන්ට ද දිය යුතුව තිබේ.

19 වන සියවසේ පසු භාගය වන විට යටත්විජිත ආණ්ඩුව විසින් විවෘත කර දෙන ලද වාණිජ අවස්ථාවන් උපයෝගී කර ගැනීම මගින් ධනය රාශිභූත කර ගත් විශාල ශ්‍රී ලාංකීය පවුල් කණ්ඩාමක් වැඩී තිබිණ. කෙසේ වුව ද මෙම පවුල්වලින් බහුතරයකට ඔවුන් උපන් කුලයට ඔවුන්ව මරණය දක්වාම නාම ලක්ෂිත කර තිබූ  දැඩි ධූරාවලීමය කුල ක්‍රමයක පැවැත්ම හේතු කොට ගෙන කිසිදු ඉහළ සමාජ පිළිගැනීමට නොහැකි විය. කුල කැලලෙන් ගැලවීමේ එක් මාර්ගයක් වූයේ බ්‍රිතාන්‍ය කිරීටයට ඔවුන්ගේ පක්ෂපාතීභාවය ශපත කිරීම හා ආණ්ඩු පාලනයට ආධාර කිරීම ය.

තත්ත්වය ඥානාන්විත ලෙස තක්සේරු කරමින් මිෂනාරිවරු සියලුම වර්ග, කුල හා ආගම්වලට අයත් පොහොසත් ළමුන් සඳහා විශේෂයෙන්ම කොළඹ අධික ගාස්තු අය කරන පාසල් විවෘත කළහ.

20 වන සියවසේ අරුණෝදය වන විට ඉංග්‍රීසි ජීවිතය තුළ ඒ වන විටත් ආවේණික ක්‍රීඩාවක් වශයෙන් පැවති ක්‍රිකට් ක්‍රීඩාව මෙම අධ්‍යාපන ක්‍රමයට හඳුන්වාදීම ස්වයංක්‍රීයවමව සිදු විය. නෙවිල් කාර්ඩුස් කියන පරිදි "ක්‍රිකට්වලින් තොරව එම භූමියෙහි ග්‍රීෂ්ම ඍතුවක් තිබෙන්නට බැරි ය."

ක්‍රිකට් ක්‍රීඩංගන, උපකරණ හා පුහුණුකරුවන් අවශ්‍ය වියදම් සහිත ක්‍රීඩාවකි. බ්‍රිතාන්‍ය මිෂනාරිවරු මෙම පාසල් ස්වල්පයට අවශ්‍ය එවැනි පහසුකම් සියල්ල සැපයූහ. ක්‍රිකට් මෙම ඉංග්‍රීසි පාසල් ක්‍රමයෙහි ක්ෂණික සාර්ථකත්වයක් අත් කර ගත්තේ ය.

එය වරප්‍රසාදිත පාසල් එනම් පොහොසතුන් සඳහා වන පාසල්වලට සීමාවී තිබීම නිසා බොහෝ ශ්‍රී ලංකිකයන් සැලකුවේ ක්‍රිකට් ඔවුන්ට ළඟා වීමට ඔබ්බෙන් වූ ක්‍රීඩාවක් ලෙස ය.

යථා කාලයේ දී මිෂනාරිවරු පුවත්පත් ප්‍රචාරයේ සහය ඇතිව ජනප්‍රිය සති අන්ත සමාජ කටයුත්තක් බවට පත්වන අන්තර් එකට බැඳීමේ තරග සංවිධානය කළහ.

පුවත්පත් රටෙහි හා පිටත පවත්වන ලද ක්‍රිකට් තරග පිළිබඳ සියලු විස්තර පල කළේ ය. ප්‍රතිඵලයක් ලෙස පාසල් ශිෂ්‍ය ක්‍රිකට් ක්‍රීඩකයෝ කවරුත් දන්නා නාම බවට පත් වූහ. එසේම පුවත්පත් ඉංග්‍රීසි ප්‍රාන්ත ක්‍රිකට්වලට පමුඛ ආවරණයක් ලබා දුන් අතර ලාංකිකයන් ඉංග්‍රීසීන්ටත් වඩා ප්‍රාන්ත ක්‍රිකට් ගැන දන්නා බව බොහෝ විට කියනු ලැබිණ.

20 වන සියවසේ අරුණෝදයත් සමග පොහොසත් විද්‍යාලවල පාසල් හැර යන්නන් සඳහා අවශ්‍යතා සැපයීමට සැලසුම් කළ ක්‍රිකට් සමාජ පිහිටුවනු ලැබිණ. ක්‍රිකට් සමාජ සිංහල ක්‍රීඩා සමාජය (SSC), ටැමිල් යූනියන්, බර්ගර් රික්‍රියේෂන් ක්ලබ් (BRC), මුවර්ස් වැනි වාර්ගික නම් දැරී ය. එහෙත් ඒ සියල්ල එකාකාරවම ඇංග්ලිකානු සාරධර්මවලින් රෝපිතව තිබිණ.

අන්තර් සමාජ තරග ක්‍රීඩා කරන ලද්දේ හුදෙක්ම ක්‍රීඩාවක් ලෙස ප්‍රීති ආස්වාදය සඳහා ය. එසේම ක්‍රීඩා සමාජ ක්‍රිකට් බ්‍රිතාන්‍යයන් සමග සමාජමය වශයෙන් මිශ්‍රවීමට දේශීයයන් සඳහා අවස්ථා විවෘත කරලීය. එලෙස 1948 දී බ්‍රිතාන්‍යය ලංකාවට නිදහස ප්‍රදානය කරන විට ක්‍රිකට් ප්‍රභූ පංතියේ ලාලසාවක් වීම පුදුමයක් නොවේ.

ආසන්න පශ්චාත් ස්වාධීනතා කාල වකවානුවෙහි ඇංග්ලිකානුකරණීයවූ ප්‍රභූ පංතිය කුඩා සුළුතරයක් වූයේ වුව ද ඔවුන්ගේ දේශපාලන දෘෂ්ටිවාදයෙන් බටහිර පක්ෂවාදී වූ අතර බලගතු දේශපාලන බලපෑම් බලයක් වශයෙන් පැවතුණි.

නිදහසෙන් පසු ආසන්නයේම පැවති මහ මැතිවරණවල දී ප්‍රභූ හිතවාදී ආණ්ඩු තේරී පත් වූ අතර ආණ්ඩුවලට නායකත්වය දුන් අගමැතිවරු තිදෙනා ප්‍රධාන පොහොසත් විද්‍යාලවල පළමු XI ක්‍රිකට්වලට ක්‍රීඩා කර තිබිණ. තව ද ඔවුහු සිංහල ක්‍රීඩා සමාජයෙහි සාමාජිකයන්ව සිටියහ.

1960 සහ 1981 අතර කාල පරිච්ඡේදය බලය ඇංග්ලිකානුකරණීයවූ ප්‍රභූන්ගෙන් නැගෙමින් සිටි සමාජවාදී හා ජාතිකවාදී කණ්ඩායම් අතට මාරුවීම නිසා ක්‍රීඩාවෙහි ජනප්‍රියතාවෙහි ප්‍රගතිය මන්දගාමී වූ එකක් වූයේ ය.

එසේ වුව ද මයිකල් තිසේරා හා අනුර තෙන්නකෝන් වැනි සැබෑ ලෝක මට්ටමේ පිතිකරුවන් ලෙස බලපෑමක් කරමින් සිටි ක්‍රීඩකයන් සමග නිල නොවන ටෙස්ට් තරග ක්‍රීඩා කිරීමේ අවස්ථාව ලබා දෙමින් 1965 දී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සහකාර සාමාජිකයෙකු බවට පත් කෙරිණ.

අභාවප්‍රාප්ත ගරු ගාමිණී දිසානායක මහතාගේ ප්‍රයත්නයන්ට ස්තුති වන්නට 1981 දී ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය ශ්‍රී ලංකාවට නිල ටෙස්ට් තත්ත්වය ප්‍රදානය කළේ ය. එය පැහැදිලි ලෙස ම අපේ ක්‍රිකට් ක්‍රීඩා ඉතිහාසයේ ඉතා වැදගත්කමකින් යුත් කාලයක් විය. මෙය ක්‍රිකට් ප්‍රභූ ක්‍රීඩාවක සිට ජනතාව සඳහා වන ක්‍රීඩාවක් බවට පරිවර්තනය වීමක ආම්භය විය.

## වර්ගවාදී කැරලි හා ලේ වැකි ගැටුම

ළමයෙකු ලෙස  මෙම බාරදූර අවස්ථාව මගේ මතකයට නැගෙන්නේ නැත. ඒ මා පස් වියැති ළමයෙකු වූ නිසා විය හැකි ය. එසේ ම එය සාකච්ඡාවේ කැපී පෙනුණු මාතෘකාවක් නොවීම නිසා වීමට ද පුළුවන. 1980 ගණන්වල මුල් අවුරුදු උතුරේ සටන්කාමිත්වය ඉදිරි වසර 30 අවලක්ෂණ කළ සම්පූර්ණ පරිමාණ සිවිල් යුද්ධයක් බවට උත්සන්නවීම මගින්  අධිපතිත්වය ලැබී ය.

1983 භීෂණ වාර්ගික කැරලි ද තරුණයන් අතරින් නැගි ලේ වැකි කොමියුනිස්ට් කැරලිකාරිත්වය ද මාගේ ළමා වියේ මාගේ මතකයන් ද සියලු ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත ද අඳුරු කරනු ලැබී ය. මම දැන් 1983 වාර්ගික කැරලි සංත්‍රාසයෙන්  යුතුව ආවර්ජනය කරමි. එහෙත් එතෙකුත් වයස අවුරුදු 6 ක් නොවූ ළමයෙකුගේ සරල පරිකල්පනය සම්බන්ධයෙන් ගත් කල එය විස්තෘත ක්‍රීඩාවේ හා විනෝදයේ කාලයක් විය. අපේ සියල්ලෝම දෙමළ වූ සමීපතම මිතුරන් 35 දෙනෙකු පමණ අපේ නිවසේ  ආරක්ෂාව ලැබූ හෙයින් මම මෙය සැහැල්ලුවෙන් නොකියමි. ඔවුන්ට දේශපාලන වශයෙන් පොළඹවනු ලැබූ මැර කණ්ඩායම්වලින් අභයස්ථානයක් අවශ්‍යව තිබූ අතර මගේ පියා විවිධ ජනවාර්ගික පසුබිම්වලින් පැමිණි තවත් බොහෝ නිර්භීත ශ්‍රී ලාංකිකයන් පරිද්දෙන් මහත් පෞද්ගලික අවදානමක් ඇතිව ඔහුගේ ගෙවල් ඔවුන් වෙනුවෙන් විවෘතව තැබී ය.

එසේ වුව ද  මට එය මගේ සියලු මිත්‍රයන් සමග දවස පුරා සෙල්ලම් කළ යුතුව තිබුණු කාලයක් විය. පාසල් වසා දැමුණු අතර අප පසුපස මිදුලෙහි පැයකට පසු පැයක් සෙල්ලම් කළ යුතු විය. අපි ක්‍රිකට්,  පාපන්දු, රවුන්ඩර්ස් සෙල්ලම් කළෙමු. .... එය ළමයෙකුගේ සිහිනයක් සැබෑ වීමක් විය. මගේ දෙමාපියන් විසින් ක්‍රීඩාවකට රළු ලෙස  බාධා කරනු ලැබූ විට කෝපයට පත් අයුරු ද මැර කණ්ඩායම් අපේ අසල්වාසී සෝදිසි කිරීම ආරම්භ කළ විට අපේ මිත්‍රයන් සමග අප සියලු දෙනා සැඟවුණු ඉහළ මාල තුළට කැඳවා ගෙන ගොස් නිහඬව සිටින්නට අණ කළ අයුරු ද මට මතක ය.

මගේ මිත්‍රයන් සොයා ගනු ලැබීමෙන් විය හැකි බිහිසුණු ප්‍රතිවිපාක මම තේරුම් නොගත්තෙමි. තව ද එම කාලය තුළ එක දවසක ඔහු වෙතට හැරී සම්පූර්ණ අහිංසකත්වයෙන් යුතුව "මගේ මිත්‍රයන් සියල්ලෝම අප සමග ජීවත් වීමට ලැබීම ඒ තරම්ම විනෝදයක් වන නිසා මෙය හැම අවුරුද්දෙම සිදු වෙනවා දැ" යි මා කියූ බව වෙනත් දිනක මගේ පියා මට මතක් කර දුන්නේ ය.

අපේ විශ්ව විද්‍යාලවලින් පැන නැගුණු ජවිපෙ නායකත්වය දුන් කොමියුනිස්ට් කැරලිකාරිත්වය 1980 ගණන්වල එපරිද්දෙන් ම බිහිසුණු විය. සාප්පු, පාසල් හා විශ්වවිද්‍යාල වසා දැමිණ. සන්ධ්‍යාවන්හි ජනතාව ඔවුන්ගේ ගෙවල්වලින් පිටතට අඩියක් තැබුවේ කලාතුරකිනි. පාර දෙපැත්තෙහි පිළිස්සුණු මල සිරුරුවල ද ගංගාවල පාවෙමින් තිබූ මල සිරුරුවල ද දර්ශනය බිය ගන්වනසුළු ප්‍රකට දසුනක් විය.

ජනතා විමුක්ති පෙරමුණට අවනත නොවූ ජනයා දරුණු ප්‍රතිවිපාකයන්ට මුහුණ දුන්හ. සියලුම පාසල්වලින් එළියට පැමිණ ඔවුන්ගේ අරමුණුවලට සහය වශයෙන් පෙළපාලි පවත්වන්නැයි පවා ඔවුහු සිසුන්ගෙන් ඉල්ලා සිටියහ.

ඔවුන්ගේ නියෝගයන්ට අවනත නොවූ පාසල් ස්වල්පයෙන් එකක් වන ත්‍රිත්ව විද්‍යාලයෙහි ඉගෙනුම ලැබීමට මම වාසනාවන්ත වීමි. එහෙත් මම ජීවත් වූයේ ධර්මරාජ විද්‍යාලයට යම්තම් පහළිනි. එහි ගේට්ටුවලින් පිටතට පැමිණි සිසුන්ට කඳුළු ගෑස් ප්‍රහාරයන්ට මුහුණ දීමට සිදු විය. අපේ වත්තේ පයිප්පයෙන් සිය ඇස් හෝදා ගැනීමට කන්දෙන් පහළට දිව එන සිසුන් මට දැකිය හැකි විය.

සිසුන්ට අය කිරීමකින් තොරව ටෙනිස් හා ක්‍රිකට් පුහුණු කළ කදිම මනුෂ්‍යයෙකු වූ මගේ පළමුවන ක්‍රිකට් පුහුණුකරුවන ඩී. එච්. ද සිල්වා මහතාට කැරලිකරුවන් විසින් ටෙනිස් ක්‍රීඩාංගනයේ දී වෙඩි තබනු ලැබී ය. යටි බඩට දෙවරක් වෙඩි වැදී තිබිය දීත් ඔහුගේ හිසට එල්ල කර තිබූ තුවක්කුව අවහිර වීම නිසා ඔහු ආශ්චර්යමත් ලෙස දිවි ගලවා ගත්තේ ය. එම කාල වකවානුව තුළ මෙන්ම පසුව බොහෝ දෙනා මෙන් ඔහු ද පිට රටට පළා ගොස් ඕස්ට්‍රේලියාවෙහි නව ජීවිතයක් ආරම්භ කළේ ය.

දශකයක් ගෙවී යන විට උතුර හා නැගෙනහිර අරගලය සම්පූර්ණ පරිමාණයේ යුද්ධයක් බවට වැඩී තිබිණ. ශ්‍රී ලංකා ආණ්ඩුව ත්‍රස්තවාදී එල්ටීටීඊය සමග අපේ රටේ සංවර්ධනය දශක ගණනාවකින් පසුපසට ඇද දැමූ යුද්ධයක නියැලී සිටියේ ය. පවුල්, සාමාන්‍යයෙන් පහළ ආර්ථික පංතිවල පවුල් ඔවුන්ගේ තරුණ තරුණියන් දහස් ගණනින් ශ්‍රී ලංකා හමුදාවේ සේවයට කැප කළහ.

යුද්ධයේ ඉදිරි පෙරමුණෙන් දුරස්ථව පැවතියා යයි පෙනෙන අග නගරයක් වන කොළඹ පවා බලගතු වාහන හා මරාගෙන මැරෙන බෝම්බ යොදා ගනිමින් ත්‍රස්තවාදීන් විසින් වටලෑමට පාත්‍ර කර තිබිණ.

සිවිල් වැසියන් හා දේශපාලන ඉලක්ක යන දෙපාර්ශවයම ඉලක්ක කර ගනිමින් ප්‍රසිද්ධ ස්ථානවල බෝම්බ තැබීම ශ්‍රී ලංකාවේ දෛනික ජීවිතයේ පිළිගත් අවදානමක් බවට පත්ව තිබිණ. බසයෙන් වැඩට යන දෙමාපියන්ට බෙදී වෙන්වී ගමන් කිරීමට සිදුව තිබිණි. ඒ ඔවුන්ගෙන් අයෙකු මිය ගිය හොත් අනෙකාට පවුල රැක බලා ගැනීම පිණිස පවුල වෙත ආපසු පැමිණිය හැකි නිසා ය. සෑම ශ්‍රී ලාංකිකයෙක් ම එම ගැටුමේ කෲරත්වය මගින් ස්පර්ශ කර තිබිණ.

ජනතාව දේශපාලනය, බලය හා යුද්ධය සම්බන්ධ මුලාවෙන් මිදී තිබිණ. අවිනිශ්චිත අනාගතයක් පිළිබඳව ඔවුහු භීතියෙන් පසු වූහ. ප්‍රචණ්ඩත්වයේ චක්‍රය නිම නොවන බව පෙනෙන්නට විය. ශ්‍රී ලංකාව එහි යුද්ධය හා ගැටුම සම්බන්ධයෙන් ප්‍රකට බවට පත් විය.

එය අප ජාතියක් වශයෙන් අනුප්‍රාණයක් - සුදුමැලි තිමිර පටලය ඉවත් කර එකෙකු ලෙස එක්සත් වුවහොත් රටක් ලෙස පෙන්වීමට සමත් ආශ්චර්යයක්, අපේ ජනතාවගේ විභවය උද්දීප්ත කරන බලාපොරොත්තුවේ ප්‍රදීපයක් සොයමින් සිටි බලාපොරොත්තු විරහිත කාලයක් විය. එම අනුප්‍රාණය 1996 දී පැමිණීමට නියමිත විය.

## අනන්‍යතා අර්බුදයක්

1995 පෙර යුගය ශ්‍රී ලංකාව හොඳ ක්‍රිකට් ක්‍රීඩකයන් බොහොමයක් බිහි කළ එහෙත් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව කළ යුතු වූ මාර්ගය අධිශික්ෂණය කර තිබුණු පැරණි යටත් විජිත බලපෑමෙන් මිදීම සඳහා අරගල කළ කාල වකවානුවක් විය.

1981 ටෙස්ට් තත්ත්වය ලබා ගැනීමෙන් පසු පවා ශ්‍රී ලංකාවේ ක්‍රිකට් අනන්‍යතා අර්බුදයකින් පෙළුණු අතර අප අපේ ක්‍රිකට් ක්‍රීඩා කළ ආකාරය තුළ වූයේ ඉතා කුඩා "ශ්‍රී ලාංකිකයෙකි." බලාපොරොත්තු පැවතියේ වුව ද අයෙකු බොහෝ සෙයින් කතා කළේ ක්‍රීඩා පිටිය හා පිටත යන දෙකෙහි දී ම චිත්තාකර්ෂණීය හා වර්ණවත් ක්‍රිකට් ක්‍රීඩකයෙකු වූ සතාසිවම් ගැන ය. ඔවුන් කියන්නේ ඔහු මැජික් යෂ්ටියක් වන් ක්‍රිකට් පිත්තක් අතෙහි රැඳි ක්‍රිකට් ක්‍රීඩකයෙකු කියා ය. තවත් විශිෂ්ඨ පිතිකරුවෙකු වූයේ දැන් අපේ ප්‍රධාන තේරීම්කරු වන වික්‍රමාන්විත නිර්භීතභාවයෙන් පිත්ත හැසිරවූ දුලිප් මෙන්ඩිස් ය.

එසේ වුව ද පොදුවේ අප ක්‍රිකට් ක්‍රීඩා කළේ පොතට අනුව සම්ප්‍රදායික ක්‍රිකට් බලාගාරවල චිරස්ථාපිත හා ගතානුගතික ශෛලීන් කොපි කරමිනි. අපට අපේම අනන්‍යතාවක් ශක්තිමත් කරන අවස්ථාවට උචිත උද්යෝගී හා සැහැල්ලුවෙන් ගන්නා ආකල්ප කිසිවක් තිබුණේ නැත.

අපට සමත් ක්‍රීඩකයන්ගෙන් යුත් තරගකාරී කණ්ඩායමක් තිබිය යුතු වූ නමුදු අපි බයාදු හා මෘදු වීමු. තනි තනි ක්‍රීඩකයන් වශයෙන් හෝ කණ්ඩායමක් වශයෙන් අපේ වටිනාකම එතෙකුත් පූර්ණ වශයෙන් විශ්වාස නොකෙළෙමු.

බොහෝ ආකාරයන්ගෙන් අප මුල් කාලීන බටහිර ඉන්දීය කණ්ඩායම් එනම් විනෝද ක්‍රීඩකයන් ලෙස ක්‍රීඩා කළ හා නිතරම වාගේ එනමුත් ප්‍රසන්න ලෙස පරාජයටපත් කැලිප්සෝ ක්‍රිකට් ක්‍රීඩකයන් වැනි යයි මම අනුමාන කරමි.

ඒ කාලයේ අපට අවශ්‍ය වූයේ නායකයෙකි. කැරට්ටුව, හැකියාව හා සියල්ලටත් වඩා ක්‍රමය වෙනස් කිරීමට, අවාසිදායක සංස්කෘතිය හා සම්ප්‍රදාය හමුවේ නැගී සිටීමට නිර්භීතබව හා ප්‍රගල්භතාව තිබුණා වූ ද විශාලතර අභිප්‍රායක් මුදුන් පමුණුවා ගැනීම සඳහා වන මාර්ගයෙහි තමන්ව පිහිටුවා ගැනීමට බිය නොවූ ද ජනතාව අතරෙන් පැමිණි ක්‍රීඩකයෙකි.

මෙම මහත් අපේක්ෂාවෙන් සිටි ගැලවුම්කරුවා පැමිණියේ අතිශයින්ම දක්ෂ හා යමතම් තරබාරු අර්ජුන රණතුංග නම් වූවකුගේ ආකාරයෙනි. ඔහු පැමිණියේ දශ ලක්ෂයකට අධික ජනතාව ඔවුන්ගේම පෞද්ගලික සිහිනයක් ලෙස වැළඳගත් අප පොදුවේ බෙදා හදාගත් උන්මාදනීය ලාලසයකින් ආදරය කළ ක්‍රීඩාව පරිවර්තනය කරමින් අපේ ක්‍රිකට් උරුමයේ මුළුමහත් ඉතිහාසය වෙනස් කිරීමට ය.

## අර්ජුනගේ නායකත්වය

මෙම කාල පරිච්ඡේදය තුළ අර්ජුනගේ නායකත්වය ගෝලීය බලයක් ලෙස අපේ පැන නැගීමට තීරණාත්මක විය. අපේ යටත් විජිත අතීතයේ විලංගුවලින් නිදහස් වීමට ඒවා බිඳ දමා නව අනන්‍යතාවක්, විශේෂ වශයෙන් ශ්‍රී ලාංකීය සාරධර්මවලින් බැඳුණු අනන්‍යතාවක්, සාමාන්‍ය ශ්‍රීලාංකිකයන් ගේ ලාලසයෙන්, දීප්තියෙන් හා චිත්තවේගයෙන් පෝෂිත අනන්‍යතාවක් ගොඩ නැගීම අවශ්‍ය වන්නේ මන්දැයි ඉතාමත් පැහැදිලිව අවබෝධකර ගත් පුද්ගලයා වූයේ අර්ජුන ය.

අර්ජුන ප්‍රතිඵලය කුමක් වුවත් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව මත ඔහුගේ සලකුණ තැබීමට අධිෂ්ඨාන කරගත්, විදේශ සම්ප්‍රදායෙන් බිඳීමට අධිෂ්ඨාන කර ගත් හා ක්‍රිකට්වල නව ජාතික සන්නමක් තැබූ මිනිසෙකු විය. ආනන්දයේ සිට සිංහල ක්‍රිකට් සමාජයට පැමිණීම ඔහුට සංස්කෘතික කම්පනයක් ඇති කළේ ය. සිංහල ක්‍රීඩා සමාජයේ ආධිපත්‍යය දරන ලද්දේ කොළඹ ඉතාමත්ම ප්‍රභූ පාසල් දෙකක්වූ ශාන්ත තෝමස් හා රාජකීය විද්‍යාලයේ සිසුන් විසිනි. එහි කමිටුවේ, සාමාජිකත්වයේ හා කණ්ඩායමේ සංයුතියේ පවා ආධිපත්‍යය දරන ලද්දේ මෙම ප්‍රභූ පාසල් විසිනි.

සංස්කෘතිය පිටස්තර යයි හැඟුනේ කෙසේ ද හා ඊට හැඩ ගැසීමට උත්සාහ කිරීම හා ඇතුළත් වීම ඔහුට අසීරු වූයේ කෙසේ ද යන්න පිළිබඳව අර්ජුනම කතා කර තිබේ. 15 වියැති පාසල් දරුවෙකු ලෙස ක්‍රීඩා සමාජයේ දැල් තුළ පුහුණු වෙමින් සිටිය දී ක්‍රීඩා සමාජයේ ජ්‍යෙෂ්ඨ භක්තිමත් ආධාරකරුවෙක් ඔහු පිළිබඳව විමසා තිබේ. ඔහු ශිෂ්ඨ සම්පන්න නොවන ආනන්ද විද්‍යාලයෙන් පැමිණියේ යයි කී විට ඔහු ඔහුගේ පැහැදිලි දක්ෂතා ක්ෂණයෙන් ඉවත ලමින් "අපට මේ ක්‍රීඩා සමාජයට කිසිදු 'සරම් ජොනියෙකු' අවශ්‍ය නැත"යි පවසා ඇත.

එහෙත් කරුණු කාරණා සිදු වෙද්දී වසර ගණනාවක් තිස්සේ අර්ජුන සිංහල ක්‍රීඩා සමාජයේ ක්‍රිකට් නායකයා වූවා පමණක් නොව ක්‍රීඩාවේ පැවැති ප්‍රභූ පාසල්වලට තිබුණ දැඩි ග්‍රහණය බිඳ දැමීමට ද ක්‍රියා කළේ ය. ඔහුගේ අරමුණ වූයේ කණ්ඩායම තුළ ආත්ම විශ්වාසය ඇති කිරීම ය, අපට පිට කොන්දක් හා තමන් තුළම ප්‍රතිපක්ෂය දැකීමට හා සමානව නැගී සිටීමට, ස්වයං අවිශ්වාසයෙන් හෝ බියෙන් තොරව තරග කිරීමට, සෞඛ්‍යමත් නොවන සම්ප්‍රදායන්ට එරෙහි වීමට හා අපේම ශ්‍රී ලාංකික අනන්‍යතාවක් වැළඳ ගැනීමට කණ්ඩායම පොළඹවන ආත්ම වටිනාකම පිළිබඳ හැඟීමක් ලබා දීම ය. ඔහු ප්‍රශ්න කළ නොහැකි අධිකාරයෙන් යුතුව අභීතව නායකත්වය දුන්නේ ය. නමුත් ඒ කැප්ටන් කූල් යන නාම සංකේතය ඔහුට ලබා දුන් සන්සුන් හා සාමූහික ආකාරයකිනි.

1996 කරා වූ අපේ වගකීම සම්බන්ධ පළමු හා ඉතාමත්ම වැදගත් අත්තිවාරම දමනු ලැබිණ. ඔහුගේ සෙබළුන් පරිස්සමින් තෝරා ගැනීම සඳහා ප්‍රථමවරට අපේ රටේ සපයාගත හැකි අහුමුළු සියල්ලට නෙත් යොමු කළ මෙම යන්තමින් අඩි බර හා නොගැලපෙන චමත්කාරයා තුළින් ශ්‍රී ලංකාවට දීප්තිමත් ජෙනරාල් වරයෙකු ලැබුණේ ය.

## විශිෂ්ඨ ක්‍රීඩකයන් සොයා යාම

අර්ජුන කිසිවෙකුටත් වඩා ඒ කාලයේ අපට මුවාතක් අවශ්‍යව තිබූ බව අවබෝධකර ගත් අතර ඒ සම්බන්ධයෙන් ඔහු දක්ෂතාවන්ගෙන් එතරම් විශිෂ්ඨ හා වඩා ඔප මට්ටම් කර ගත්විට විරුද්ධ පාර්ශවය ව්‍යාකූල හා විනාශ කරනු ඇති ක්‍රීඩකයන් සෙවීමෙහි යෙදුනේ ය.

ක්‍රිකට් ක්‍රීඩාවේ දී කාල නිශ්චය සියල්ල වේ. මෙය ශ්‍රී ලංකා කණ්ඩායම සම්බන්ධයෙන් ද ඔප්පුවී ඇත. ජාතියක් ලෙස සනත් ජයසූරියගේ සහ මුත්තයියා මුරලිදරන්ගේ දෙමාපියන්ට විශාලතම අවශ්‍යතාවයේ කාලයේ අපේ ක්‍රිකට්වලට සේවය කිරීමට මෙම විශිෂ්ඨයින් දෙදෙනා බිහි කිරීම සම්බන්ධයෙන් අපි සදාකල් ස්තුතිවන්ත විය යුත්තෙමු. මාතර සිට පැමිණි සනත් නිරහංකාර පසුබිමකින් ආ ඉමහත් දක්ෂතාවයකින් යුත් මිනිසෙක් විය. එම දක්ෂතාව මෙහෙයවීමකින් හෝ ඔබ දැමීමකින් තොර විය. අර්ජුන රණතුංගගේ මෙහෙයවීම යටතේ ක්‍රීඩාවේ එතෙක් මෙතෙක් දන්නා ලද ඉතාමත්ම සංහාරක පිති හරඹ බලයන්ගෙන් එකක් බවට සන්නද්ධ කෙරුණු දක්ෂතාවක් බවට පත් විය. එය පෙර කිසිදා නොදුටු දක්ෂතාවක් වූ අතර දැන් ඔහුගේ විශ්‍රාම ගැනීමත් සමග නැවත කිසිදා දක්නට නොලැබෙනු ඇත. මුරලි නුවර කඳුකරයේ සිට තරමක් පොහොසත් පසුබිමකින් පැමිණියේ ය. වේග පන්දු යවන්නෙකු ලෙස පටන් ගෙන පසුව ඔහු දඟ පන්දු යවන්නෙකු බවට පත් විය. ඔහුගේ පන්දු යවන බාහුවෙහි ස්වාභාවික විකලාංගතාවකින් ආශීර්වාද ලත් ඔහුට සිතිය නොහැකි කෝණවලින් බෝලය දඟ කවා එතරම් දඟ කැවීමක් කිරීමට ඉඩ ලැබුණි. ඔහු අතග දඟ පන්දු පිට දඟ පන්දු බවට පත් කළේ ය.

අර්ජුනගේ කණ්ඩායම දැන් සුදුසු තැනේ විය. එය සිත් ගන්නා දක්ෂතා සංචිතයක් විය. එහෙත් ඔවුන් එතෙකුත් කණ්ඩායමක් වූයේ නැත. 1996 ලෝක කුසලානය ජයග්‍රහණය කිරීම දිගු කාලීන පරමාර්ථයක් විය. ඔවුන්ට ඒකරාශීවන ලක්ෂ්‍යයක්, "කණ්ඩායමික" හැඟීමක් ඔවුන්ට ලබා දෙන එක්සත්වීමේ ලක්ෂ්‍යයක්, ඔවුන්ට පොදු ඉලක්කයක් දෙමින් කණ්ඩායම එකට බඳිනු ලබන සිද්ධියක් පමණක් නොව කණ්ඩායම හා එහි ගමනට ජාතියක සමස්ත සහය පෙළගස්වන සිද්ධියක් සොයා ගත යුතු විය.

මෙය 1995 බොක්සිං දිනයෙහි මෙල්බෝන් ක්‍රිකට් පිටියේ දී මෙය සිදු විය. ඒ වන විට එය සාක්ෂාත් කර ගන තිබුණේ ස්වල්පයකින් නමුදු චෝදිත බෝල දමා ගැසීම සම්බන්ධයෙන් මුරලිව නිපන්දු යැවි බවට තීන්දු කිරීම දුර දිග යන ප්‍රතිවිපාක ඇති කළේ ය. ප්‍රශ්නය සමස්ත ශ්‍රී ලාංකීය ජාතියේ ම උදහස මතු කළේ ය. මුරලි තවදුරටත් තනි නොවී ය. ඔහුගේ වේදනාව, අපහසුවට පත් කිරීම, හා කෝපය සියලු දෙනා විසින් බෙදාහදා ගන්නා ලදී. විවේචකයන් කුමක් කීව ද අර්ජුන හා කණ්ඩායම

මුරලි පිටුපස සිට නන් ආකාරයේ සමස්ත ජාතියක්ම සාඩම්බරයට පත් කළේ ය. එම අවස්ථාවේ ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩකයන් සරල ලෙස හැඳින් වූයේ " අපේ ළමයි" හෝ අපේ කොල්ලෝ කියා ය.

ගිය දෙය ශ්‍රී ලාංකීය ක්‍රිකට් ලෝලියාගේ මුල් වෙන් කිරිම වූ අතර එහි ස්ථානය ගත්තේ එම මිනිසුන් 15 දෙනා සම්බන්ධයෙන් අභිනවයෙන් සොයාගත් ආදරය යි. ඔවුහු අපේ පුත්තු බවට පත් වූහ. සහෝදරයෝ බවට පත් වූහ. ශ්‍රී ලාංකිකයෝ ඔවුන් සමග සිටගත් අතර ඔවුන්ගේ හිරිහැර හා පීඩාවන් බෙදා හදා ගත්හ.

මෙල්බර්න්හිදී මුරලි නිපන්දු යැවූ ලෙස නම් කිරීමේ තීරණය සියලු ශ්‍රී ලාංකීකයන්ට එකට එක කිරිමෙන් තොරව තිබෙන්නට ඉඩ නොහැරිය යුතු අපහාසයක් විය. එය ශ්‍රී ලාංකා කණ්ඩායම සිතිය නොහැකි දෙය කරවීමට එනම් අයිසීසී තත්ත්වය ලැබීමෙන් හුදෙක් වසර 14කට පසු ලෝක ශූරයන් බවට පත්වීමට පොළඹවා ලූ උත්තේජකය විය.

1981ට පෙර ජාතික ක්‍රීඩකයන්ගෙන් 80% කට් වැඩි ප්‍රමාණයක් පැමිණියේ ප්‍රභූ පාසැල් වලිනි. නමුත් 1996 වන විට එම පාසැල් ලෝක කුසලාන කණ්ඩායමට එකදු ක්‍රීඩකයෙකු වත් දායක නොකළ බව සඳහන් කිරිම වැදගත් ය.

1996 ලෝක කුසලානේ එක්සත් කිරීමේ සංසටකය

එම ලෝක කුසලාන ජයග්‍රහනයේ බලපෑම විශාල විය. එය ක්‍රීඩාවේ බිම් මට්ටම් පුළුල් කිරිම පමණක් නොව එක් බෙදාහදා ගත් ලාලසාවකට සියලු සාමාජිකයන් සම්බන්ධ කිරිම යන දෙකම කළේ ය. ප්‍රථම වරට පිට පළාත්වලින් හා ආණ්ඩුවේ පාසල්වලින් පැමිණි ළමුන්ට ක්‍රිකට් ඔවුන්ගේම බවට පත්කර ගැනීමට අවකාශ සැලසිණ. ක්‍රිකට් පොදු ජනතාවට විවෘත විය. මෙය අත නොගැසූ දක්ෂතාවයට විවෘත වීමට පමණක් නොව ඉහළම තලයේදි ක්‍රීඩා කිරීමට යථාර්ථවාදි අවස්ථාවක් සලසා දුන්නේ ය.

මෙම බිම් මට්ටමේ ක්‍රීඩකයන් සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන්ගේ ස්වාභාවික ලක්ෂණ තමන් සමග ගෙන ආ අතර මේ දක්වා අහිමිව තිබූ ලාලසයක්, සතුටක් හා තීව්‍රතාවක් ඇතිව ක්‍රීඩාවේ යෙදුනහ.

ඔවුන් සනත් , මුරලි , කළු, හා අරවින්ද ක්‍රීඩා කරනවා නරඹා තිබිණ. සනත්ලා එක් දින ක්‍රිකට් පිළිබඳ සංකල්පය වෙනස් කළා පමණක් නොව ශ්‍රී ලාංකිකයින් ලෙස ක්ෂණිකව හඳුනාගත හැකි බවක් ද සලසා දුන්නේ ය.

අප තව දුරටත් බයාදු හෝ මෘදු හෝ නොවැදගත් කණ්ඩායමක් නොවේ. අපි ලෝකයේ හොඳම අය සමග ක්‍රීඩා කර හා පරදවනු ලැබ ඇත්තෙමු . අප එය කළේ ව්‍යාජයෙන් හෝ ලැජ්ජාවෙන් තොරව අපට ජාතික සාරධර්ම අපේ සාමුහික සංස්කෘතීන් හා හුරු පුරුදු මතු කරන ලද හා කීර්තියට පත් කරන ලද ආකාරයකිනි. එ අපේම යැයි ආඩම්බරයෙන් කිව හැකි ක්‍රිකට් සලකුණක්, දේශීය ජීවගුණයෙන් යුත් ශෛලියක් හා අපේ උරුමයෙහි යහපත්වූ සියල්ල මූර්තිමත් කළ සංඥා එළියක් විය.

ලෝක කුසලාන ජයග්‍රහණය අපට ක්‍රිකට් ක්‍රීඩකයන් ලෙස අපේ සමාජයේ අපේ ශක්තිය අවබෝධ කර ගැනීමට නව ශක්තියක් ලබා දුන්නේ ය. ලෝක කුසලානය තුළ රටක් නව ආරම්භයක් සොයා ගත්තේ ය. ශ්‍රී ලාංකාව වඩා හෙඳ අනාගතයක් පිළිබඳ ඔවුන්ගේ සිහින ගොඩ නැගීමේ නව ප්‍රබෝදයක් ගෙන දුන්නේ ය.

මෙහි විවිධ පසුබිම්වලින්, වර්ගයන්ගෙන් හා ආගම්වලින් පැමිණි හැමෙකාම තමන්ගේ පෞද්ගලිකභාවය පිළබඳ දරුණු ලෙස ආඩම්බර වූ එහෙත් හුදු කණ්ඩායමක් ලෙස නොව පවුලක් ලෙස එක්සත්වු පුද්ගලයෝ 15 දෙනෙක් වූහ.

ඔවුහු අපේ සමාජයේ සමස්තය නියෝජනය කරමින් සැබෑ ශ්‍රී ලාංකිකයෙකු වීමට තිබිය යුතුවු පැහැදිලි ගුණය ඔවුන්ට විදහා දක්වමින් සෑම ශ්‍රී ලාංකීයකුට ම දිදුලන ආදර්ශයක් සපයමින් පොදු ජාතික අපේක්ෂාවක් සඳහා සටන් කළහ.

1996 ලෝක කුසලාන සියලු ශ්‍රී ලාංකිකයන්ට පොදු බවක්, බෙදී ගිය සමාජයකට සැබෑ ජාතික අනන්‍යතාවයක් ලබා දුන් සාමුහික සතුටේ හා පරමාර්ථයේ එක් ලක්ෂණයක් ලබා දුන්නේ ය. සියලු සමාජ නපුරු සුවපත් කළ මහෞෂධය වූයේ ය. බිහිසුණු ස්වාභාවික විපත්තීන් හා බෙදජනක සිවිල් යුද්ධය තුළින් රටට වාසිදායක වන සේ නැගි සිටිමට අවස්ථාව සලසා දුන්නේ ය.

1996 ලෝක කුසලාන ජයග්‍රහණය ඔවුන්ගේ රට දෙස වෙනස්ව බැලීමට ජනතාව පොළඹවාලී ය. ක්‍රීඩාව විසින් ත්‍රස්තවාදය හා දේශපාලන කැරලි කෝලාහල යටපත් කර දමනු ලැබීය. එය සෑම කෙනෙකුටම ඔවුන්ගේ හදවත්වලට ආදරණීය වීමට යමක් සැපයු අතර සාමාන්‍ය ජනතාවට ඔවුන්ගේ ජීවිතයෙන් ගොඩ ඒමට ආධාර කළේ ය.

එසේම කණ්ඩායම ශ්‍රී ලාංකීය සමාජය විවිධ පසුබිම්කලින්, වර්ගයන්ගෙන්, මහා ආගම්වලින් පැමිණි ක්‍රීඩකයන් සමග ඔවුන්ගේ පොදු සතුට, ඔවුන්ගේ ලාලසාව වන එකිනෙකා කෙරෙහි ඔවුන්ගේ මාතෘභූමිය කෙරෙහි වන ආදරය බෙදා හදාගත යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ක්ෂුද්‍ර නිරූපණයක් බවට පත් විය. යුද්ධය නොතකා අපි මෙහි එක්ව ක්‍රීඩා කරමින් සිටිමු. ශ්‍රී ලාංකීය කණ්ඩායම සුසංගත කරන සාධකයක් බවට පත් විය.

## ලෝක ශූරයින් වීමේ ආර්ථික බලපෑම

ඓතිහාසික ජයග්‍රහණයෙන් පසු ශ්‍රී ලංකාවේ සමස්ත ක්‍රිකට් ක්‍රීඩාව විප්ලවීයකරණය වූයේ ය. රූපවාහිනි මුදල් ක්‍රිකට් පාලක මණ්ඩලයේ භාණ්ඩාගාරයට වැක්කෙරෙන්න වූයේ ය. විශාල ජාතික හා බහු ජාතික සංස්ථා අනුග්‍රාහක අයිතීන් ලබා ගැනීම සඳහා සටන් වැදුනහ.

ක්‍රිකට් ක්‍රිඩකයෝ ජාතික කොන්ත්‍රාත් හා පැවරුම් ගනුදෙනු යන දෙයාකාරයෙන්ම තථ්‍ය මුදල් උපයන්නට පටන් ගත්හ. ප්‍රථම වරට ක්‍රිකට් ක්‍රිඩකයෝ යෝධ එලිමහන් දැන්වීම් පුවරුවල හා

රූපවාහිනි වෙළඳ දැන්වීම් නිෂ්පාදනවල සොසේජස්වල සිට සෙලුලර් ජාල දක්වා ප්‍රචාරණයේ ඕනෑම දෙයක පෙනී සිටින්නට වූහ.

ක්‍රිකට් ශක්‍ය වෘත්තියක් බවට පත්වූ අතර ක්‍රිකට් ක්‍රිඩකයෝ පිළිම හා පරමාදර්ශ බවට පත් වූහ. ඒ කාලය වනතෙක් මා ක්‍රිකට් සෙල්ලම් කළේ නියම උද්යෝගයකින් හා පරමාර්ථයකින් නොවේ. මා වෙනුවෙන් ක්‍රීඩා කරන්නට කවදාවත් සිතුවේ හෝ සිහින දැක්කේ නැත. අස්ගිරියේ ශ්‍රී ලංකාව හා කෙන්යාව අතර තරගය නැරඹීමෙන් පසු මෙය වෙනස් විය. එය මගේ පාසලෙහි අවසන් වසර විය. සනත්, ගුරුසිංහ හා අරවින්ද ද සිල්වා විදහා දැක්වූ අති ප්‍රබල පිතිකරණය නැරඹූ විට මගේ රට වෙනුවෙන් ක්‍රීඩා කිරීමේ මගේ දැක්මෙහි පළමු බීජ මගේ සිතෙහි හා හදවතෙහි පැලවිණ. එම උද්යෝගයේ බීජය සති දෙකකට පමණ පසු ලාහෝර්හි පැවති කීර්තිමත් අවසන් තරගය රූපවාහිනියෙන් නැරඹීමෙන් පසු ජීවිතයට කා වැදුනි. ශ්‍රී ලංකාවේ සෑම කෙනෙක් ම එම අවසාන තරගය පැවතිය දී තමන් සිටියේ කොහේදැයි සිහිපත් කරයි.

ජාතියක ප්‍රීති ඝෝෂාවේ හඬ කිසිදු බෝම්බයකට හෝ පුපුරන ෂෙල් වෙඩියකට හෝ ගිල්වා දැමිය නොහැකි විය. ක්‍රිකට් අපේ ජාතික මනෝභාවයෙහි අඛණ්ඩ හා වැදගත් අංගයක් බවට පත් විය. අපේ ක්‍රිකට් අපේ ජීවිතවල හැම දෙයක්ම,අපේ සිනහව සහ කඳුළු, අපේ ආගන්තුක සත්කාරක බව හා අපේ ත්‍යාගශීලී බව, අපේ සංගීතය හා අපේ ආහාර පාන හැම දෙයක්ම මූර්තිමත් කළේය. එය යුද්ධයෙන් ව්‍යසනයට පත් දිවයිනක පියවි තත්ත්වය, බලාපොරොත්තුව හා ප්‍රබෝදය විය. ඒ තුළ අපේ අප්‍රමාණ ජනවර්ග ශා ආගම් විසින් පොහොසත් බවට පත් කරනු ලැබූ අපේ සංස්කෘතිය හා උරුමය විය. ඒ තුළ යටත් පිරිසෙයින් ටික කලකට හෝ පටු දේශපාලනය හා බෙදීම් මගින් ස්පර්ශ නොකෙරිණ. ජීවිතය යනු ක්‍රිකට් නොවන බව සත්තකින්ම දුකකි. එය එසේ වූයේ නම් අප මුග්ධ යුද්ධයක පැසවන තුවාල නොදකිනු ඇත.

## ක්‍රිකට් ක්‍රීඩකයන් සඳහා වඩා විශාල භූමිකා

එසේ ම ක්‍රිකට්වල පැන නැගීම හා ශ්‍රී ලංකා සමාජය ඇතුළත ක්‍රිකට්වල නව භූමිකාව හුදෙක් පිට්ටනියෙහි ක්‍රීඩා කරනවාට වඩා විශාල වගකීම් ක්‍රිකට් ක්‍රීඩකයන්ට තිබූ බව ද අදහස් වේ. පිට්ටනියෙන් පිට අපට ජීවත් වීමට ධනාත්මක ජීවන ශෛලියක් අවශ්‍ය වන අතර එසේ ම අප ආපසු දීම ද අවශ්‍ය ය. සෑම තරගයකදීම අපට ප්‍රශංසා කරන ජනයාම ඔවුන්ගේ ජීවිතවලට අපෙන් ධනාත්මකව පෙරළා දායකත්වයක් අපේක්ෂා කරයි. හුදෙක් පිට්ටනිය පමණක් නොව එයින් පිටත ද අපට පෙළඹවාලීම අවශ්‍ය විය.

සුනාමිය එවැනි එක් සිද්ධියකි. එය නැගී සිටීමේදී ඉතිරි කළ මරණ හා විනාශය අපේ රටට දැරිය නොහැකි පහරක් විය. එය එන විට අප සිටියේ නවසීලන්තයේ පළමු එක්දින ජාත්‍යන්තර තරගයට ක්‍රිඩා කරමිනි. අප නරක ලෙස සෙල්ලම් කර තිබූ අතර බලාපොරොත්තු කඩව විවේකාගාරයේ සිටින විට සුපුරුදු ලෙස සනත්ගේ දුරකථනය බීප් හඬ දෙන්නට විය. ඔහු sms පණිවිඩ කියවා මේ

දැන් අමුතු සිදුවීමක් "මුහුදු රැළිවලින් සමහර ප්‍රදේශ යටවී තිබෙන" බව පැවසී ය. එය අස්වාභාවික උදමක් විය යුතු යයි සිතා අපි මුලදී එතරම් කනස්සල්ලට පත් නොවීමු. අපි හෝ හෝටලයට පැමිණි ප්‍රවෘත්ති බැලූ විටයි අපට විනාශයේ විශාලත්වය අවබෝධ කරගත්තේ. වෙරළබඩ නගර පිසදාගෙන ගිය රැලිවල දර්ශන හා ජල පහරට දහස් ගණන් ජීවිත ගසාගෙන යාම බැලීම බිය ගන්වන සුළු ය. අපට එය සිදුවූවා යයි විශ්වාස කළ නොහැකි විය. සිදුවන්නේ කුමක්දැයි දැන ගැනීමට අපි ගෙදරට ඇමතීමු. "එය ඇත්ත දැ"යි  අපි ඇසීමු. "පින්තූර ඇත්ත විය හැක්කේ කෙසේ දැ"? යි අපි සිතීමු.

අප සියලු දෙනාටම අවශ්‍ය වූයේ ආපසු ගෙදර ගොස් අපේ පවුල් හා අපේ ජනතාව සමග එක්ව නැගී සිටීමට ය. දෙසැම්බර් 31 දී ගුවන් තොටුපොලට ගොඩ බැසීම මට මතක ය. රාත්‍රියක සාමාන්‍යයෙන් මුළු කොළඹ උත්සව සඳහා විදුලි පහන් දැක්වේ. සංගීතයක් හා සිනා හඬ ඇසේ. එහෙත් නගරය හිස් හා අඳුරු ය, මනෝභාවය දුකෙන් දුර්මුඛ හා නිසසල ය.

අප ආධාර කළ යුත්තේ කෙසේදැයි සිතමින් සිටි අතර තුර මුරලි උද්යෝගය සැපයීමට කඩිනම් විය. මුරලිව ඔහුගේ වෘත්තීය ජීවිතයේදී හැම පැත්තෙන්ම ඇද ගැනීමට උත්සාහ කළ පුද්ගලයෙකි. එහෙත් ඔහු හැමවිට ඔහුගේ කණ්ඩායම් සගයින් සහ රට වැසියන් සමග එකට සිටියේ ය. කිසිදු පැකිලීමකින් තොරව ඔහු ඔහුගේ දේශීය හා විදේශීය සම්බන්ධතාවලට දුරකතනයෙන් ඇමතී ය. දින කීපයක් තුළ ලෝක ආහාර වැඩ සටහන සමග එක්ව ඔහු හානියට පත් පෙදෙස්වලට හා ජනතාවට බෙදා දීමට කන්ටේනරයක් පිරවූ ආහාර, වතුර හා ඇඳුම් පැළඳුම් සූදානම් කළේ ය. මව්තකර ලෙස අදාළ බලධාරින් බෙදා හැරීමේ වගකීම භාර ගැනීම ප්‍රතික්ෂේප කළ විට මුරලි බඩු ගෙන යන වාහන කණ්ඩායම සමග යාම ඔහු භාර ගත්තේය. මා හට සම්බන්ධ වන්නැයි කළ ආරාධනය මට භාග්‍යයක් විය. මගේ බිරිඳ සහ මම, මහේල, රුචිර පෙරේරා, අපේ භෞත චිකිත්සක සී.ජේ. ක්ලාක් හා තවත් බොහෝ ස්වේච්ඡා ක්‍රියාකාරීහු ආහාර වාහන පෙළ සමග ගියහ. මෙම අත්දැකීම පුද්ගලයෙකු ලෙස මා වෙනසකට භාජනය කළේ ය.

අප නතර වූයේ දඹුල්ලට තරමක් උතුරෙන් පොළොන්නරුවේ ය. අපි සුනාමියෙන් විනාශයට පත්වූ ත්‍රිකුණාමලය, මඩකලපුව වැනි වෙරළ බඩ නගර කරා ගියෙමු. එසේම පසු සංචාරයන්හි දී ගාල්ල, හම්බන්තොට වැනි දකුණේ නගර කරා ද ගියෙමු. අපි හමුදාව හා එල්ටීටීඊ ය මගින් පවත්වාගෙන ගිය නවාතැන් කඳවුරුවලට ගියෙමු. සමහර ඒවා ඔවුන් හවුලේ පාලනය කළෝ ය. දරුණු ගැටුම්කාරී පාර්ශව දෙකක් පිහිට අවශ්‍ය කාලයක ජනතාවට උදව්කිරීමට එකට ගෙනෙනු ලැබිණ. සෑම කඳවුරකදීම තරුණ මහලු ජනයාගේ මුහුණුවල ලියවී තිබුණු ඛේදවාචකයේ ප්‍රතිඵල අපි දුටිමු. වියළී ගිය හිස් ඇස් දුකින් පිරී තිබිණ. නිවාස, ආදරය කරන්නන් හා ජීවිකා වෘත්තීන් සඳහා වූ දැඩි ආශාව බිහිසුණු රළ පහර විසින් අහිමි කර තිබිණ.

එහෙත් අප සමග, ඔවුන්ගේ ක්‍රිකට් ක්‍රීඩකයන් සමග ඔවුහු සිනාවක් පෑමට සමත් වූහ. ත්‍රිකුණාමලයේ දකුණට ආසන්න කින්නියා කඳවුරෙහි එතරම් දේ අහිමි වූ ජනතාවගේ පළමු ප්‍රතිචාරය වූයේ අපේ පවුල් හොඳින් ඉන්නවා ද යනුයි. සනත්ගේ හා උපුල් චන්දනගේ මවුන් තුවාල වූ බව ඇසූ විට ඔවුහු

අවාසනාවන්ත තත්ත්වය අතිශයෝක්තියෙන් කීවේවත් ඒ තුළ ගිලී සිටියේවත් නැත. ඔවුන්ගේ සැලකිල්ල ඔවුන් වටා සිටි සියල්ලන් සඳහා එක හා සමාන විය. අප සංචාරය කළ සෑම කඳවුරකම සත්‍ය මෙය විය. ඔවුන්ගේ ව්‍යසනය මැද්දේ ඔවුහු අප්‍රතිහත, ප්‍රකෘතියට පත්වීමේ, ආදරයේ, දයාවේ, ත්‍යාගශීලිභාවයේ, ආගන්තුක සත්කාරයේ හා මහත්මාභාවයේ ශ්‍රී ලාංකික ජීව ගුණය විදහා පෑහ. මෙය අප අපේ ක්‍රිකට් ක්‍රිඩාවේදී දකින ජීවගුණයම යි. මෙලෙස අපේ අඳුරුතම පැයේදී රටක් එකිනෙකාට ආධාර කිරීමට හා ආදරය කිරීමට එක්සත්ව හා ශක්තිමත්ව එකට නැගී සිටියේ ය. මම මේ සියල්ල අත්දුටුවෙමි. මෙම ජනතාව මට දෙන ලද වරප්‍රසාදය ක්‍රීඩා පිටියේදී ඔවුන් නියෝජනය කිරීමේ ගෞරවය හා වගකීම, ඔවුන් ආදරය කරන හා මහත් භක්තියෙන් පුදන ක්‍රීඩාවක් සෙල්ලම් කිරීම අයථා ලෙස යෙදීමට මම කිසි දිනක නැඹුරු නොවන බව මටම ශපත කරගතිමි. පශ්චාත් සුනාමි සහන හා යළි ගොඩනැගීම සඳහා ඔවුන්ගේ පෞද්ගලික ධාරිතාවෙන් ක්‍රිකට් ක්‍රීඩකයන් රඟපාන ලද භූමිකාව ඔවුන් තුළ වන ජාතියකගේ ජනතාව කෙරෙහි වන විශ්වාසයේ වැදගත්කම පෙන්නුම් කළේ ය. මුරලි යළිත් නැගී සිටියේ ය. ඔහුගේ කළමනාකරු කුෂිල් ගුණසේකර සමග වූ ඔහුගේ සීනිගම ව්‍යාපෘතියට 1000කට අධික නිවාස ප්‍රමාණයක් ගොඩනැගීම ද ඇතුළත් විය. එය මවිතකර ය. මෙයට MCC ආධාර කළ බව මම දනිමි.

## ලාහෝර් ප්‍රහාරය

මගේ ජීවිත කාලය තුළ ශ්‍රී ලංකාවේදී මෘ කිසි දිනක ඍජුවම හිංසනයට මුහුණ දීමේ අත්දැකීමක් නොලැබීමට තරම් මම වාසනාවන්ත වීමි.. වසර ගණනාවක් පුරා බොහෝ බෝම්බ පිපිරීම් ප්‍රමාණයක් සිදුව තිබේ. එහෙත් මා කිසි දිනක වැරදි වෙලාවක වැරදි ස්ථානයක සිට නැත.

මෙම විටින් විට පිපිරෙන බෝම්බ හැරුණු විට කොළඹ ජීවිතය සාපේක්ෂ වශයෙන් සාමාන්‍ය විය. යුද්ධයෙන් කායිකව වෙන්ව සිටීමේ සුඛෝපභෝගය ජනතාවට තිබිණ. ළමෝ පාසල් ගියහ. ජනයා වැඩට ගියහ. මම ක්‍රිකට් ක්‍රීඩා කළෙමි.

එසේ වුව ද රටේ අනෙකුත් කොටස්වල ජනතාව එක්කෝ ඔවුන්ගේ මව් බිම ආරක්ෂා කිරීමේදී නැතහොත් යුද කලාපයක ජීවත් වීමට සිදුවීම නිසා හුදෙක් භූගෝලීය තත්ත්වයන්ගෙන් බේරී සිටීමට උත්සාහ කිරීමේදී දෛනිකව ඔවුන්ගේ ජීවිත හානියේ මාවතක තැබීමට සිදුව තිබිණ. ඔවුන්ට පැවැත්ම සඳහා වෙඩි උණ්ඩවලින්, ෂෙල් වෙඩිවලින්, බිම් බෝම්බවලින් හා අත් බෝම්බවලින් ගැලවී සිටීම අනිවාර්ය විය. මෙය මා ඍජුවම සම්බන්ධ නැති අත්දැකීමක් විය. ඔවුන් සම්බන්ධයෙන් මහත් අනුකම්පාවක් හා දයාවක් මා වෙත තිබිණ. එහෙත් මට සමාන්තරව ගත හැකි සැබෑ අත්දැකීමක් නොවීය.

ඒ 2009 හි අප පකිස්ථානයේ සංචාරය කරනු ලැබූ තෙක් පමණි. අපි කරච්චි හා ලාහෝර්වල ටෙස්ට් තරග දෙකක් සඳහා පිටත් වූවෙමු. පළමුවන ටෙස්ට් තරඟය විශාල සිද්ධියකින් තොරව නිමා විය.

දෙවන ටෙස්ට් තරඟයේ දී ද තුන්වන දිනයේ පිට්ටනියෙන් පිටව යන විට විශාල පළමු ඉනිමක් සහිතව සිටියෙමු. පකිස්ථාන් බසයක් එනතෙක් නැවතී සිටිනු වෙනුවට කලින් පිටත්වීමට කියනු ලැබිණ. අපි පන්දු යවන්නන් සඳහා දැඩි වෙහෙසකාරී දිනයක් බලාපොරොත්තුවෙන් සිටියෙමු. බසයේ පිටුපස වේග පන්දු යවන්නන් හඬ නගා ඔවුන්ගේ මැසිවිලි කීහ. තිලාන් තුෂාර ඔහුගේ කොන්ද කැඩෙන්න ළඟ යයි ශබ්ද නගා පැමිණිලි කරමින් කෑගැසූ බව මට විශේෂයෙන් මතක ය. ඔහු බෝම්බයක් පුපුරා ගියොත් හොඳ යයි විහිලු කළේ එවිට ලාහෝරයෙන් පිටවී ගෙදර යා හැකි යයි කියමිනි. තත්පර 30ක් ගියේ නැත. රතිඤ්ඤා පුපුරනවා වැනි හඬක් ඇසිණ. හදිසියෙන්ම ඉදිරියෙන් කෑ ගැසීමක් ඇසිණ. "පහත් වෙන්න, ඔවුන් බස් එකට වෙඩි තියනවා." ප්‍රතිචාරය ක්ෂණික විය. හැම අයෙක්ම ආවරණය වීම සඳහා දිගා වෙමින් ආසන පේළි අතර තීරුවේ හෝ සීට් පිටුපස සැඟවී ගත්හ. ඉතා කුඩා අවකාශයක අපි සියල්ලෝම එකිනෙකා මත වැතිර ගතිමු. එවිට වෙඩි උණ්ඩ වදින්නට පටන් ගති. එය ටින් වහලකට වැස්ස වැටෙනවා බඳු විය. බසයට ඉදිරියට යා නොහැකි වූ අතර තුවක්කුකරුවන්ට පහසු ඉලක්කයක් විය. බසය හිල්කර ගෙන වෙඩි උණ්ඩ පුපුරන විට අපට කළ හැකි දෙය වූයේ මරණය හෝ තුවාල සිදු නොවේවායි අපේක්ෂාවෙන් යාඥා කරමින් නිසලව නිශ්ශබ්දව සිටීම පමණ ය. හදිසියේම බසයේ පිටුපස වාඩිවී සිටි මහේල ඔහුගේ දණහිස පහළට වෙඩි වැදුන බව සිතන්නේ යයි කියමින් කෑගසන්නට විය. මම වැතිරී සිටියේ තිලාන්ට එහායිනි. ඔහුගේ කලවයේ පිටුපසට උණ්ඩයක් වැදීමෙන් ඔහු කෙඳිරි ගාන්නට විය. ඔහු දෙස බැලීමට මගේ හිස ඔසවන විට කිසියම් දෙයක් සීස් ගා මගේ කණ පසුකරගෙන ගිය බව දැනිණ. උණ්ඩයක් හඬ නගමින් සීට් එකේ පැත්තක වැදින. ඒ ටික වෙලාවකට මගේ හිස තිබුණ ස්ථානය ය. කිසියම් දෙයක් මගේ උරහිසට වැදුන බව හැඟුණ අතර එය හිරි වැටිණ. මට වෙඩි වැදුන බව මම දනිමි. නමුත් යන්තම් සහනයක් දැනිණ. උණ්ඩ හිසට නොවැදීම ගැන මම යාඥා කළෙමි. ඔහුගේ මංගල සංචාරය යෙදුණු තරංග පරණවිතාන ද සිටියේ මගේ ළඟට ය. ඔහු සිට ගත්තේ ය. උණ්ඩ ඔහු වටා පියාඹා යන්නට විය. ඔහුගේ ලෙයින් තෙත්වූ පපුව අල්ලා ගෙන "මට වෙඩි වැදුනා" යි කගසන්නට විය. ඔහු ඔහුගේ සීට් එකට ඇද වැටිණ. පෙනෙන හැටියට ඔහුට සිහි නැති විය. මම ඔහු බැල මෙසේ සිතුවෙමි. "ඔහ් මගේ දෙවියනි, ඔබ පළමු බෝලයෙන් දැවී ගියේ ය, ඊළඟ ඉනිමේදී දුවද්දී දැවී ගියේ ය. දැන් ඔබට වෙඩි වැදී ඇත. මොන තරම් බිහිසුණු පළමුවන සංචාරයක් ද?"

ඔබ සිතන්නේ කෙසේ ද යනු අමුතු ය. මගේ ජීවිතය ගෙවී යනවා මම නොදැක්කෙමි. උමතු සන්ත්‍රාසයක් ඇත්තේ නැත. එම අවස්ථාවේ සිදුවන්නේ කුමක් ද යන්න ගැන ඒකාන්ත පැහැදිලිතාවයක්හා දැනුවත් බවක් තිබිණ. බසය හඬ නගාගෙන ගමන් අරඹන්නට පණ පොවනවා මට අසේ. දිල්ෂාන් "පදවන්න, පදවන්න" කියමින් රියදුරාට කොඳුරමින් සිටී. අපි වේගය වැඩි කර වැරදි මාර්ගයකට වැටී අවසානයේ ක්‍රීඩාංගනයේ අසල ආරක්ෂිත ස්ථානයකට ආවෙමු. බසයෙන් බැසීම සඳහා දඩිබිඩියක් විය. තරංග පරණවිතාන සිට ගත්තේ ය. ඔහු තවමත් ලේ ගලමින් සිටී. වෙඩි උණ්ඩය ඔහුගේ පපුවේ මැද ඇටයෙහි යන්තමින් නැවතී ඇත. බසයේ බඳ පන්නරය වී තිබීම උණ්ඩයෙහි වේගය අඩුවී එය ඇටයෙහි නතර වීමට ප්‍රමාණවත්ව ඇත. තිලාන්ට බසයෙන් බැසීමට ආධාර කෙරිණ. විවේක කාමරය තුළ වූයේ චිත්තාවේගයන්ගේ මිශ්‍රණයකි. කෝපය, සහනය, සතුට

ක්‍රීඩකයන් හා පුහුණු කාර්ය මණ්ඩලය අතුරු වෛද්‍ය සේවකයන් විසින් පරීක්ෂා කෙරිණ. තිලාන් හා පරණවිතාන ගිලන් රථයකින් රෝහලට ගෙන යනු ලැබිණ.

අපි සියලු දෙනාම විවේක කාමරයෙහි වාඩිවී සිදුවූයේ කුමක් ද යන්න ගැන කතා කළෙමු. මිනිත්තු කීපයක් ඇතුළතසිනාව හා විහිලු ගලාගෙන යන්නට පටන් ගති. අපි ප්‍රථම වරට හිංසනයේ ඉලක්කයක් බවට පත්වීමු.

අපි ගැලවී ගතිමු. අපේ සමහර සහෝදර ශ්‍රී ලාංකිකයන් වසර 30 කට ආසන්න කාලයක් අත්දුටුවේ කුමක්දැයි අපි සියල්ලෝම අවබෝධ කොට ගතිමු. ඔවුන්ගේ නිර්භීතභාවය හා පරාර්ථකාමීභාවය සම්බන්ධයෙන් නව ගෞරවයක් හා ගෞරව සම්ප්‍රයුක්ත බියක් වූයේ ය. කොතරම් ඉක්මනින් අප අපට එල්ල කළ ප්‍රහාරයෙන් ගැලවුනා ද යන්න සැලකිය යුතු ය. අප කායිකව තුවාල ලැබුව ද මානසිකව අපි ශක්තිමත්ව සිටියෙමු.

ප්‍රහාරයෙන් පැය කීපයකට පසු අපි ලාහෝරයේ ගුවන් හමුදා කඳවුරට ගුවනින් ගෙන ගියෙමු. බහුවිධ උණ්ඩ කැබලි තුවාල නිසා බැන්ඩේජ්වලින් හිස ඔතා සිටි අජන්ත මෙන්ඩිස් පෝකර් තරගයක් යෝජනා කළේ ය. තිලාන් ආපසු ගෙනවිත් තිබිණ. බෙහෙත්වලින් නිදි ගන්වා තිබුණ ද සම්පූර්ණයෙන් සිහිය තිබිණ. අප සමග සිටීම ගැන ඔහුට අපි විහිලු කළෙමු. ඔහු පෙරළා සිනාසුණි.

අපිට වෙඩි තැබිණ, ග්‍රෙනේඩවලින් පහර දෙනු ලැබිණ. අපට තුවාල සිදුවිණ. එහෙත් අප බියට පත් නොවූයෙමු. අපි අසරණ නොවීමු. "අපි ශ්‍රී ලාංකිකයෝ වෙමු."යි අපිම සිතුවෙමු. "අප දැඩිය, අපට දුෂ්කරතා ජයගත හැකිය, අප ජයගන්නේ අපේ ජීවගුණය ශක්තිමත් නිසා ය."

ප්‍රහාරයෙන් ස්වල්ප වේලාවකට පසු පැවති අපේ සම්මුඛ සාකච්ඡාවලදී ලෝකය දුටු දෙය මෙය යි. අපි සන්සුන්ව සිටියෙමු. අපි සාමූහිකව සිටියෙමු. බුද්ධිමත් වූයෙමු. අපේ චිත්තවේග නිලනොවන තානාපතීන් වශයෙන් අපේ භූමිකාවට අවංක විය යුතු ය.

පකිස්ථානයේ සිට කොළඹට අපේ පැමිණීමෙන් සතියකට පසු මම නගරයේ රිය පදවමින් සිටියදී මුර පොළකදී නවතනු ලැබිණ. ප්‍රහාරයෙන් පසු මගේ තත්ත්වය ගැන සෙබළා ආචාරශීලීව මගෙන් විමසී ය. මං හොඳින් යයි පිළිතුරු දුන් මම අපි අත්දුටුවේ මිනිත්තු කීපයක කාලයක් පමණයි. නමුත් හැම පුවත් සිරස්තලයක්ම එය පල කළා. සෙබළුන් ලෙස හැමදාම ඔවුන් අත්දකින්නේ කුමක් ද කියා ඇසීමි. සෙබළා මා දෙස බලා මෙසේ පිළිතුරු දුනි. "ඒක හරි මම මැරුණොත් ඒ මගේ රැකියාව නිසයි. මම ඒකට සූදානම්. නමුත් ඔබ වීරයෙක්, ඔබ මැරුණා නම් එය අපේ රටට විශාල පාඩුවක්."

මම පුදුමයට පත්වීමි. කොහොම ද මේ මිනිසා මගේ ජීවිතයට වඩා ඔහුගේ ජීවිතය අඩුවෙන් අගය කළේ? ඔහුගේ අවංකභාවය අති ප්‍රබල ය. මට නිහතමානි හැඟීමක් ඇති විය. ක්‍රිකට් සහ ක්‍රිකට්

ක්‍රීඩකයන් ශ්‍රී ලාංකිකයන් තුළින් මතුකරන ලාලසාව මෙය යි. මා මගේ වෘත්තියේදී දෛනිකව දෙන්නට වෙහෙසෙන ආදරය මෙය යි.

## පශ්චාත් 1996 බල දේශපාලනය

අපි යළිත් අපේ ක්‍රිකට්වලට ආවොත් අනර්ථදායක ක්‍රිකට් පාලක මණ්ඩල දේශපාලනය ආරම්භ වීම හා යහ අර්ථවත් අවංක මිනිසුන් විසින් නායකත්වය දෙන ලද ස්වෙච්ඡා මෙහෙයුමකින් යුත් සංවිධානයක සිට අපේ ක්‍රිකට් පරිපාලනය බහු මිලියන ඩොලර් සංවිධානයකට පරිවර්තනය වීමත් සම්බන්ධයෙන් ලෝක කුසලානය ද ගෙන ආවේ අඩු පිළිගැනීමකින් යුත් වෙනස් කම්ය. එතැන් පටන් ක්‍රිකට් පාලන මණ්ඩලය  පැවතියේ කලහකාරී තත්ත්වයකය.

ශ්‍රී ලංකාවේ ක්‍රිකට් හා දේශපාලනය සමානව් තිබේ. ගරු ගාමිණී දිසානායකගේ උත්සාහයන් ශ්‍රී ලංකාවට ටෙස්ට් තත්ත්වය ලබා ගැනීමේදී වැදගත් කාර්ය කොටසක් ඉටු කළේ ය. එසේම ඔහු අස්ගිරිය ජාත්‍යන්තර  ක්‍රිකට් ක්‍රීඩාංගනය ගොඩ නැගීමේදී ද වැදගත් විය. අපේ  ක්‍රිකට්වල ළමා කාලයේදී රාජ්‍ය අනුග්‍රහයෙන් හා අරමුදල් සැපයුමෙන් තොරව ක්‍රීඩාව පවත්වාගෙන යාම දුෂ්කර විය. ලෝක කුසලාන සඳහා ඕස්ට්‍රේලියානු හා බටහිර ඉන්දීය කොදෙව් අපේ රටට පැමිණීම ප්‍රතික්ෂේප කළ විට  ආණ්ඩුවේ මාර්ග ඔස්සේයි ඒකාබද්ධ ලෝක මිත්‍රත්ව XI  පැමිණ  මෙහි ක්‍රිකට් ක්‍රීඩා කිරිමට ආරක්ෂා සහිත යයි ලෝකයට පෙන්වීමට කොළඹදි ක්‍රීඩා කළේ.

අපේ සමාජයට ක්‍රීකට්වල වැදගත්කම වූයේ එය හැම කාලයෙහිම යහ සාධක රාජ්‍ය අනුග්‍රහය භුක්ති විඳීම ය.

ශ්‍රී ලංකාවට ජාතික කණ්ඩායමක් තෝරා ගැනිමට ඊට ක්‍රීඩා අමාත්‍යංශයේ සාමාජිකත්වය තිබිය යුතු ය. කිසිදු කණ්ඩායමකට ක්‍රීඩා අමාත්‍යවරයාගේ අවසාන අනුමතියෙන් තොරව ක්‍රීඩාවෙහි යෙදිය නොහැකි ය. එය සත්තකින්ම මණ්ඩලය විසින් පත් කළ තේරුම් කරුවන් අධිතීරණය කර ඕනෑම වේලාවක ඒ වන විටත් තෝරා ගෙන ඇති කණ්ඩායක්  යළි තෝරන්නැයි ඉල්ලා සිටිය හැකි විශිෂ්ඨ ක්‍රමයකි. ක්‍රීඩා අමාත්‍යවරයාට ද පරීක්ෂණ මගින් දූෂණ මුල්‍ය අක්‍රමිකතා හෙළි වූවොත් ඔහුගේ සුවිශේෂ බලතල ක්‍රියාත්මක කර ක්‍රිකට් පාලක මණ්ලය විසුරුවා හැරිය හැකි ය.

1996 ජයග්‍රහණයත් සමග මුදල් හා බලය මණ්ඩලය හා ක්‍රීඩකයන් වෙත පැමිණියේය. කණ්ඩායම ඇතුළතින්  එන ක්‍රීඩකයන් ද ක්‍රිකට් පාලක මණ්ඩලය ඇතුළත බල තරගවලට මැදිහත්ව ඇත. මේ විදිහට බලයට තේරී පත්වන නිලධාරින් හිලව් වශයෙන් ක්‍රීඩකයාගේ පක්ෂපාතිත්වය ඔවුන්ගේ අරමුණු සඳහා යොදා ගනියි.  සමහරවිට මණ්ඩ්ලයේ දේශපාලනය කණ්ඩායම තුළට ද ගලා යමින් බෙදීම්වලට, අයහපත් හැඟීවලට හා අවිශ්වාසයට මග පාදයි.

උමතු බල අරගලයක් තුළ පරිපාලනයෙහි වගවීම හා විනිවිදභාවය ද ක්‍රියාකාරිත්වයේ විශ්වසනීයභාවය ද නැතිව ගොස් ශ්‍රී ලංකා ක්‍රිකට් ස්ථිරතාවන් නැති පැහැදිලි පරිපාලනයක් නැති තත්ත්වයකට වැටීමට මග පාදා තිබේ. සභාපතිවරුන් හා තෝරා පත් කළ විධායක කමිටු එනු යනු ඇත. ආණ්ඩුව තෝ රා පත් කරන අන්තර් කමිටු පත් කිරීම ද විසුරුවා හැරීම ද කරනු ඇත. 1996න් පසු ක්‍රිකට් පාලක මණ්ඩලය පාලනය හා පරිපාලනය කරනු ලැබුවේ එක්කෝ පෞද්ගලිකව නැතහොත් ප්‍රතියුක්තකයෙකුගේ මාර්ගයෙන් හෝ පත්කිරීම හෝ තේරීපත්වීම මත රඳා පවතිමින් මාරුවෙන් මාරුවට එන හා යන හොඳ තේරුමක් ඇති පුද්ගලයන් අතලොස්සකි. අවාසනාවකට ඔවුන්ගේ බලය තහවුරුකර ගැනීමට හෝ චිරස්ථායි කර ගැනීමට ඔවුහු පරිපාලනයේ දොරටු ක්‍රිකට් පාලක මණ්ඩලයේ මූලයයන් හා සම්පත් දූෂණයට හා හිතුවක්කාර නාස්තියට මග පාදන පක්ෂග්‍රාහි ගජ මිතුරන්ට විවෘත කරති.

එය අවුල් සහගත විය, තවමත් අවුල් සහගත ය. ඡන්ද මිලදී ගැනීම් හා හොර ඡන්ද දැමීමේ චෝදනා, සෑම පාර්ශවයකින්ම සිදුවන බලපෑම් නිසා වන ක්‍රීඩක මැදිහත්වීම් හා අවි ලෙලවීම් හා කැත ගුටි කෙළි ඇතුළු වාර්ෂික මහ සබාවල ප්‍රචණ්ඩ ක්‍රියා පවා මට මතකයට ගත හැකි තරම් දිගු කාලයක් ක්‍රිකට් පාලක මණ්ඩල මැතිවරණ තුළ සලකුණු වී තිබේ.

කණ්ඩායමට එය හා පරිපාලනය අතර ස්වරාක්ෂකයක් නැති වී ඇත. ක්‍රීඩකයන් පක්ෂපාතිත්වයන් හා අන්‍යොන්‍ය වරප්‍රසාද ලබා ගැනීම සඳහා බලයේ සිටින සාමාජිකයන් වෙතට ඍජුව ප්‍රවේශ වීම සාමාන්‍ය බවට පත්ව තිබේ. 1999 සිට පරිපාලනයෙහි හා ක්‍රීඩක ආකල්පවල මෙම සියලු වෙනස්කම් 1996 පැවති සමීපව බැඳුණු ඒකකයක් වූ දෙය බෙදාහදා ගත් දැක්මක් හෝ කණ්ඩායම් හැඟීමක් නැති පුද්ගලයන්ගේ එකතුවක් බවට පරිවර්තනය කර තිබේ.

1999 දී එංගලන්තයේ පැවති ලෝක කුසලානය අන්ත පරාජයක් විය. පළමු වටයෙන්ම විසි විය. එසේ වුව ද වාසනාවකට කණ්ඩායමේ ව්‍යසනකාරී කාර්ය සාධනය ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ගතිකයන් ඇතුළත වැඩිමනත් වෙනස්කම් සඳහා උත්තේජනයක් බව සනාථ කෙරුණි. ක්‍රීඩකයන්ගේ නව මිශ්‍රණයක් ද තාරුණ්‍යයේ හා අත්දැකීමේ කදිම සංයෝගයක් ද මගින් සපයන ලද සන්දර්භය සනත්, මාවන් හා මහේල ගේ වඩා සහම්තික හා සියල්ල ඇතුළත් කරගන්නා නායකත්වය යටතේ ආ දශකය තුළ කණ්ඩායම ඇතුළත පැරණි ධූරාවලි ව්‍යුහයන් අහෝසි කර දැමී ය.

1999 සිට ගොඩනැගුණු නව කණ්ඩායම් සංස්කෘතිය තුළ පුද්ගලයන් පිළිගනු ලැබිණ. සැලකිල්ලට ගත යුතු එකම දේය වූයේ කණ්ඩායමට දක්වන කැපවීම හා විශ්වාසය යි. පුද්ගලභාවය හා විවාදය පිළිගනු ලැබිණ. ගෞරවය ඉල්ලා සිටියේ නැත, උපයා ගති. මණ්ඩලයේ කලබගැනිවලින් කණ්ඩායම ඈත් කර පවත්වා ගැනීම කරා වන නව කැපවීමක් වූයේ ය. එය අපේ කණ්ඩායමේ ගතිකත්වයෙන් සම්පූර්ණව බැහැර කිරීම දුෂ්කර වී තිබිණ. මක්නිසා ද අපව ආපසු ඇද ගැනීමේ අනවරත ප්‍රයත්න ද දුර්වලත්වයේ කාලවල සැකයක් නිසා ක්‍රීඩකයන් පැති මාරු කිරීම ද නිසා ය. තවමත් එක අරමුණක්

එනම් ක්‍රීඩා පිටියේදී ජය ගැනීම කරා වන අපේ සාමූහික ප්‍රයත්නයන් ආරක්ෂා කිරීමට හා පෙළඹවීමට අපි සමත්ව සිටිමු.

අප වඩා හොඳ පරිපාලනයක් අපේක්ෂා කළ යුතුව තිබේ. පරිපාලනය කණ්ඩායම විසින් වසර ගණනාවක් තිස්සේ ආරක්ෂිත කරනු ලැබූ එම සාරධර්ම ම: අවංකත්වය, පාරදෘශ්‍යභාවය, කැපවීම හා විනය ක්‍රියාවට නැගීම අවශ්‍ය ය.

පරිපාලනය වඩාත් වෘත්තිමය බවට පත්වීමට, ඍජුව සිතීමට හා පාරදෘශ්‍යවන්නට සමත් වන්නේ නැතිනම් එවිට අපි පොදු මිනිසා පරාරෝපණය කිරීමේ අවදානම ගන්නෙමු. සත්තකින්ම මෙය දැනටමත් සිදුවෙමින් තිබේ. භක්තිමත් ලෝලීහු වැඩි වැඩියෙන් මුලාවෙන් මිදෙමින් සිටිති. මෙය ඉතා අනතුරුදායක ය. මන්ද ක්‍රීඩාව තිරසරව පවත්වා ගෙන යන්නේ පරිපාලකයන්වත් ක්‍රීඩකයන්වත් නොව ක්‍රිකට්වලට ආදරය කරන ජනතාව නිසා ය. ක්‍රිකට්වලට බලය දෙන්නේ ඔවුන්ගේ ලාලසාවයි. ඔවුන් ක්‍රිකට්වලට ඔවුන්ගේ පිටුපස හැරවුවහොත් එවිට සමස්ත පද්ධතියම කඩා වැටෙනු ඇත.

මෙයට විසඳුම ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය කිසියම් අනර්ථදායක දේශපාලන මැදිහත් වීමකින් යුත් හා දූෂණයේ හා අයථා පාලනය පිළිබඳ චෝදනා එල්ලවන සාමාජික පාලක මණ්ඩල තහනම් කිරීමේ ස්ථාවරයක් ගැනීම විය හැකි ය. මෙය නියෝජිත කණ්ඩායම් ඉදිරිපත් කිරීමේ හැකියාව හෝ අයිසීසීයෙන් අරමුදල් හා අනෙකුත් ප්‍රතිලාභ ලැබීම හෝ නිශේධ කරනු ඇත. එහෙත් ශ්‍රී ලාංකිකයෙක් වශයෙන් අපට ම පිළිතුරු සොයා ගැනීමේ ශක්තිය තිබෙන බවට මම බලාපොරොත්තු තබමි.

## දක්ෂතාව මගින් බලය සැපයෙන කණ්ඩායමක්

කණ්ඩායමේ ව්‍යූහය හා සංස්කෘතිය එය විසින් ම ක්‍රමයෙන් විකාශනය වෙමින් තිබෙන අතර අපේ ක්‍රීඩා බිමෙහි සාර්ථකත්වය ප්‍රාථමිකව මෙහෙය වෙනු ලැබෙන්නේ හුදු දක්ෂතාවය හා මුරලි, සනත්, අරවින්ද, මහේල හා ලසිත් වැනි මෑත කාලවලදී මතුකරගත් විශිෂ්ඨ ලෙස දක්ෂ ක්‍රීඩකයන්ගේ ජීව ගුණය විසිනි.

අපේ පාසල් ක්‍රිකට් ව්‍යූහය අත්‍යන්තයෙන්ම ශක්තිමත් වුව ද අපේ ක්‍රීඩා සමාජ ව්‍යූහය යල්පිනූ එකක් වෙයි. ක්‍රීඩා සමාජ 20ක් අතර ක්‍රීඩකයන් දියාරු කර දැමීම සමග ජාතික පුහුණු කාර්ය මණ්ඩලයට වැඩිමනත් සංවර්ධනය සඳහා දක්ෂ ක්‍රීඩකයන් පහසුවෙන් හඳුනාගෙන පුහුණු කර ගැනීමට හැකියාව ලබා නොදේ. ක්‍රීඩා සමාජවල, තරඟාවලිවල තරඟකාරිත්වයේ අඩුව ඒවායින් පන්නරය ලැබූ පළමු පන්තියේ වෘත්තීය ක්‍රීඩකයන් නිෂ්පාදනය කර ගැනීමට ඉඩ නොදෙයි.

කැටිකර දියුණු කිරීම සඳහා මෙම ව්‍යුහය වෙනස් කිරීමට දරන ලද විවිධ උත්සාහයන්ට පරිපාලනය හා අදාළ ක්‍රීඩා සමාජ විසින් විරෝධය පා තිබේ. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ තේරීපත්වූ ඕනෑම ක්‍රිකට් පාලක මණ්ඩලයක් මේ ක්‍රීඩා සමාජ වරදකරුවන් කළොත් ඡන්දය පැවැත්වෙන විට ඡන්ද අහිමිවීමේ අවදානමකට මුහුණ දීම ය.

ඒ අතරම අපේ පරිපාලනයේ අස්ථායිතාව අපට අවශ්‍ය කරන වේගවත් වෙනසට දැවැන්ත බාධකයක් වෙයි. සත්තකින්ම මෙම ක්‍රමය තිබියදීත් අප බොහෝ ලෝක මට්ටමේ ක්‍රීඩකයන් බිහි කිරීම මවිතකර ය.

කෙසේ වුව ද මෙහි උත්සාහය වන්නේ සමහරවිට අපේ විශාලතම දුර්වලතාව වී ඇත්තේ අපේ විශාලතම ශක්තිය බවය යන්න ය. ඒ අර්ධ වශයෙන් ව්‍යුහයේ අඩුව නිසා ය. ලසිත්/ සනත්/ මුරලි හා මෙන්ඩිස් වැනි අය විධිමත් පාඨ ග්‍රන්ථ පුහුණුවෙන් බේරී තිබීම සම්බන්ධයෙන් අප වාසනාවන්ත ය.

ඔවුන් මූලධාර්මික පුහුණුවට ආවරණය වී තිබුණි නම්  ඔවුන්ගේ දක්ෂතා මොටවීමට ඉතා හොඳ අවස්ථාවක් තිබුණි. සියලු සම්භාව්‍යතාවන් අනුව ඔවුන් උදාසීනත්වයට ඇද වැටෙන්න ඉඩ තිබුණි.

## ශ්‍රී ලංකාව හමුවේ ඇති අභියෝගය

එසේ වුවත් බහුල සද්වාභාවික දක්ෂතා තිබියදීත් අපට අපේ ක්‍රීකට් ව්‍යුහය වෙනස් කිරිම අවශ්‍ය ය. ආත්මාර්ථකාමි වනවාට වඩා අප ශ්‍රී ලාංකික වීම අවශ්‍ය ය. අපේ ක්‍රිකට් ව්‍යුහය සංකේන්ද්‍රණය කර හොඳම ක්‍රීඩකයන් හැම විටම එකිනෙකා සමග ක්‍රීඩා කිරීම සහතික කිරීම අවශ්‍ය ය.

නව්‍යමයව සිතීම සහ නිදහස් ප්‍රකාශනය යන දෙකට ම ඉඩ සලසමින් මෙය අප විවෘත මනසකින් කිරීම අවශ්‍ය ය. ඇතැම් පැතිවලින් අප එය දැනටමත් කරමින් සිටිමු. කෙසේ වෙතත් විශේෂයෙන්ම අපේ පුහුණු දෙපාර්තමේන්තුව සම්ප්‍රදායික නොව දක්ෂතා ගවේශණයෙහි ක්‍රියාකාරීව නියැලී සිටී.

අපේ ක්‍රිකකට් වඩා ශක්තිමත් වන්නේ එය නිදහස් , ධෛර්ය සම්පන්න වන විට ය. එම නිසා අප ක්‍රීඩකයන් ඔවුන්ගේ අදහස් ප්‍රකාශකිරිමට හා නවෝත්පාදනයන්ට විවෘත වීමට දිරිගැන්විය යුතු ය.

මෑතකදී දිසත්‍රික් පුහුණු කරුවෙකු විසින් පිටපලාත් වල පන්දු යැවීමේ කඳවුරක් පවත්වාගෙන යන බවට ජාතික පුහුණුකරුවන්ට තොරතුරක් ලැබුණු සිද්ධියක් විය. ඔහු සීමා ඉර කරා හෙමින් දිව ගොස් අනතුරුව ගුවනේ සිට පන්දුව කඩා බිඳගෙන යනවා වැනි පිම්මකින් මුදා හරින වොලි බෝල් ක්‍රීඩකයෙකු සොයාගෙන ඇත. ඔහුගේ පිම්ම ඔහුව ෆලෝ ත්‍රෲ එකේදී ඔහුව තණ තීරුව මත තරමක් දුරින් පතිත කරවයි.  දිස්ත්‍රික් පුහුණු කරු ඔහුගේ පන්දු  යැවීම පැය භාගයක් වීඩියෝ

රෙකෝඩ් කර ඇත. වීඩියෝ පටය නැරඹූ කොළඹ ජාතික පුහුණු කරුවන් කුතුහලයෙන් යුතුව සතියකට පසු විධිමත් පුහුණුව සඳහා ඔහුට ආරාධනාකර ඇත. පසුව දුරකථන ඇමතුමකින් කොන්දේ වේදනාවක් නිසා රෝහල්ගතව ඔහු සිටි බව දැන ගැනීමට ලැබී තිබේ. ඔහු ඔහුගේ ජීවිතයේ කිසි දිනක මිනිත්තු 30කට වඩා එක දිගට පන්දු යැවීමක් කර නැත.

ශ්‍රී ලංකාවේ ඈත ගමක තැපැල් මුද්‍රාව වැදුණු තවත් ලිපියක් ලැබී ඇත. ලියූ තැනැත්තා ශ්‍රී ලංකාවෙහි සොයා නොගත් වේගවත්ම පන්දු යවන්නායැයි කියා තිබුණි. දිස්ත්‍රික් පුහුණුකරු මෙම හිමිකම් කියාපෑම පරීක්ෂා කිරිමේදි ලියුම්කරු ලොස් වියෙහි පසුවන බෞද්ධ භික්ෂුවක් බව සොයාගෙන ඇත. තවමත් සිවුරේ සිටිද්දීම පන්දු යවා පෙන්වීමට එම භික්ෂුව අවස්ථාවක් දෙන ලෙස ඉල්ලා ඇත. මෙලෙස ශ්‍රී ලංකාවේ ක්‍රිකට් පූජ්‍ය පක්ෂය පවා පොළඹවමින් තිබේ.

එම අවස්ථාවේ විශිෂ්ඨ දක්ෂතා කෙරෙහි වන ආශාව ප්‍රතිඵල ගෙන දී නැත. එහෙත් පුහුණු කාර්ය මණ්ඩලය අපේ ක්‍රිකට් තව දුරටත් ඉදිරියට ගෙන යනු ඇත. ඊළඟ අත්භූත පන්දු යවන්නා හෝ ක්‍රිකට් ක්‍රීඩකයා මතුකර ගැනීමේ ඔවුන්ගේ සෝදිසිය සුරක්ෂණය කර ගත් යුතු ය.

## ශ්‍රීලංකාවේ නව යුගයෙහි ක්‍රිකට් ක්‍රීඩාවෙහි වැඩි වන වැදගත්කම

අප මොහොත ග්‍රහණය කර ගැනිමට සමත් නම් එවිට ශ්‍රී ලංකාවේ ක්‍රීකට් හි අනාගතය ඉතා දීප්තිමත්ව පවතිනු ඇත. අපේ දිවයිනේ අනාගතයෙහි ක්‍රිකට්වලට ඒ හා වැදගත් භූමිකාවක් රඟපාන්නට තිබෙන නිසා අප මෙය කළ යුතු යයි මම යාඥා කරමි. ක්‍රිකට් ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අන්ධකාර දවස්වලදී සියලුම ප්‍රජාවන් යෝධ පීඩාවන්ගෙන් පෙළුන යුගයක දී තීරණාත්මක භූමිකාවක් රඟ පෑවේය. එලෙසම ප්‍රතිසන්ධානයේ හා ප්‍රතිෂ්ඨාපනයේ තීරණාත්මක කාල පරිජේදයකට. සියලුම ශ්‍රී ලංකිකයන් සාමය හා එක්සත් බව අපේක්ෂා කරන සිත් අලලන කාලපරිජේදයකට ප්‍රවේශ වන විට ඊටත් වඩා විශාල වැදගත් කමක් කණ්ඩායමේ හැසිරීමට හා කාර්ය සාධනයට තිබෙනු ඇත. එමෙන්ම නව දක්ෂතා සංචිත විවෘත වන උතුරේ හා නැගෙනහිර හුදකලා ප්‍රජාවක් යළි සංවිධානය කරන කාලපරිච්ජේදය ද ක්‍රිකට් සම්බන්ධයෙන් සිත් අලලන කාලපරිච්ජේදයක් වනු ඇත.

ක්‍රිකට්වල ජීව ගුණයට විනෝදය හා සතුට සපයමින් සමාජය ඇතුළත යහපත සඳහා වන මාර්ගෝපදේශක බලයක් ලෙස පැවතිය හැකි ය හා පැවතිය යුතු ය. එසේම එය අප සියල්ල අපේ ජීවිතවලට ප්‍රවේශ විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ සියල්ලටම දිදුලන ආදර්ශයක් ද වනු ඇත.

දැන් යුද්ධය අවසාන ය, ශ්‍රී ලංකාව සාමයේ හා සමෘද්ධියේ නව අනාගතයක් අපේක්ෂා කරයි. මම සදාකාලිකවම මෙයට කෘතඥ වෙමි. එහි තේරුම මගේ දරුවන් අපේ ජීවිතවල දෛනික කොටසක් වශයෙන් යුද්ධයෙන් හා හිංසනයෙන් තොරව වැඩෙනු ඇති බව ය. ඔවුන් එහි භීෂණත්වය ඍජුව නොව ඇතැම් විට ඉතිහාස පංතියේදී හෝ සංවාද තුළින් ඉගෙනගනු ඇත. දැන් ඔවුන් බුක්ති විඳින නිදහස් හා සුරක්ෂිතතාව වෙනුවෙන් අපේ රට හා රටේ ජනතාව ගෙවන ලද මහා බිහිසුණු මිල ඔවුන් තේරුම් ගැනීම හා තක්සේරු කිරීම වැදගත් ය.

අපේ ක්‍රිකට්වලදී අපි විශිෂ්ඨ ජීව ගුණයක්, සහශ්‍ර දෙක හමාකරට අධික කාලයක් විහිදෙන ඉතිහාසයකින් උගත් පාඩම් මගින් පොහොසත් ජීව ගුණයන් විදහා දක්වමු. අපේ ක්‍රිකට්වලදී  අපේ ජනතාවගේ චරිතය, අපේ ඉතිහාසය, සංස්කෘතිය හා සම්ප්‍රදාය, අපේ සිනහව, අපේ සතුට, අපේ කඳුළු හා දුක්ක දෝමනස්ස ඔබ දකින්නෙහි ය. එය චිත්තවේගයෙන් හා දක්ෂතාවයෙන් පොහොසත් ය. ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයෙකු ලෙස මගේ වගකීම වන්නේ මෙම අලංකාර ක්‍රීඩාව තවදුරටත් පොහොසත් කිරීම ය. එයට එකතු කිරීම හා එය උසස් කිරීම ය. අනෙකුත් ක්‍රිකට් ක්‍රීඩකයන්ට අනුගමනය කිරීම සඳහා වඩා පොහොසත් උරුමයක් ඉතිරි කිරීම ය.

ශ්‍රී ලංකා අනන්‍යතාව මගේ මනසෙහි අති උත්කෘෂ්ටව තබා ගනිමින් මම මෙය කරන්නෙමි. ක්‍රීඩාව තදින් හා සාධාරණව කරන්නෙමි. ශ්‍රී ලංකාවට ආඩම්බරයෙන් හා සාධනීයව ලෝකයට කතා කළ හැකි හඬක් වන්නෙමි. මගේ පක්ෂපාති බව සාමාන්‍ය ශ්‍රී ලාංකීය ලෝලියාට ය. අපේ දිවයිනේ රිද්මයට එකෙක් ලෙස සාමූහිකව හද ගැහෙන මිලියන 20 ක ජනතාවට ය. නොමියෙන හා සදා භක්තිමත් ආදරයකින් පිරුණු අපේ මේ ක්‍රීඩාවට ය.

විවිධ ජාතීන්ට, කුලවලට, ජනවර්ගයන්ට හා ආගම්වලට අයත් පොදු ජාතික ව්‍යායාමයක් සඳහා එක්සත් වීම මගින් එකට එකතුව ඔවුන්ගේ විවිධත්ව සමරණ ලෝලීන්, ඔවුන් මගේ අත්තිවාරම ය, ඔවුන් මගේ පවුල ය. මට ඔවුන් සමග මගේ ක්‍රිකට් ක්‍රීඩා කරන්නෙමි. ඔවුන්ගේ ජීව ගුණය ක්‍රිකට්වල සැබෑ ජීව ගුණය ය, මා සමග වනුයේ මගේ සියලු ජනයා ය. ම දමිළ, සිංහල, මුස්ලිම් හා බර්ගර් වන්නෙමි. මම බෞද්ධයෙකු, හින්දු භක්තිකයෙකු, ඉස්ලාමය හා ක්‍රිස්තියානිය අනුගමනය කරන්නෙකු වෙමි. මම අද සහ හැමවිට ම සාඩම්බර ශ්‍රී ලාංකිකයෙක් මි.